Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2023), Vol. 08 (01)

# The *Sphoṭa* and Perception of the Sentential Meaning: A Semantic Investigation based on the *Sphoṭa* Theory

K. M. D. L. Kariyapperuma

Independent Researcher, Thanayama Road, Kakunawa, Mahawa, Sri Lanka

**Article Info**

Article History:
Received 10 Sep 2022
Accepted 25 Oct 2022
Issue Published Online
01 January 2023

**Key Words:**
Language
Meaning
Perception
Sentence
Sphoṭa

*Corresponding author
E-mail address:
dinushalakmalkar@gmail.com

https://orcid.org/0000-0003-0982-9942

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v08i01.04

VJHSS (2023), Vol. 08 (01), pp. 49-63

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

CC BY

Faculty of Humanities and Social Sciences 2023

## ABSTRACT

*The transmission of meaning is the main purpose of the language or the unique communication tool. Each single linguistic sign contains a conventional meaning. Perception of meaning is achieved by listening to any utterance or sentence uttered by the speaker in speech and by reading a sentence in reading. The theory of Sphoṭa that was enhanced by Bhartruhari in Vākyapadīya can be identified as the ideal oriental linguistic theory which elaborates the process of perceiving the meaning of a sentence. In this process, the whole sentence is heard and considered rather than its individual elements. The main purpose of this paper which is based on the research problem of "how the meaning of a sentence is perceived" is to explore the semantical process of the perception of sentencial meaning, with reference to the theoretical interpretation of Sphoṭa. In order to investigate the research problem, data analysis of literary sources was carried out following the qualitative research methodology. Through the critical analysis of facts, it was possible to conclude that the Sphoṭa theory reflected in the ancient oriental semantic analysis is ideal and ubiquitous; in terms of that, the meaning of a sentence is perceived not by the individual elements but by listening to the whole sentence, and the Sphoṭa is the concluded feeling or the entire sense which is generated in mind after hearing the entire sentence or utterance.*

**මාතෘකාව**

ස්ඵෝටය සහ වාක්‍යයෙහි අර්ථප්‍රතීතිය: ස්ඵෝටවාදය ඇසුරින් සිදු කෙරෙන අර්ථ විචාරාත්මක විමර්ශනයක්

## 1. හැඳින්වීම

භාෂාවෙහි මූලික ම හා ප්‍රමුඛතම කාර්යය වනුයේ සන්නිවේදනය යි. සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් මානව භාෂාව උසස් වන්නේ එහි ඇති ක්‍රමවත්භාවය සහ අර්ථ ජනනය කිරීමෙහි ලා භාෂාවෙහි පවත්නා වූ විශිෂ්ට ශක්‍යතාව කරණ කොට ගෙන ය. කිසියම් භාෂාමය ප්‍රකාශනයකින් අපේක්ෂිත සන්නිවේදන කර්තව්‍යය ඉටු වීමට නම් එකී භාෂාමය ප්‍රකාශනයෙහි නොහොත් වාගාලාපයෙහි අර්ථය, අදාළ ශ්‍රාවකයා, නැතහොත් පාඨකයා හෝ පොදුවේ ගතහොත් සන්නිවේදන ක්‍රියාවලියට අනුකූල ව නම් ග්‍රාහකයා විසින් මැනැවින් අවබෝධ කොට ගනු ලැබීම අවශ්‍ය වේ. ශ්‍රවණය හෝ පඨනය මැනැවින් සිදු වුව ද එහි අර්ථාවබෝධය හරිහැටි සිදු නොවුණහොත් හෝ ව්‍යාකූල අර්ථයක් ග්‍රහණය කරගතහොත් සන්නිවේදන ඉෂ්ටාර්ථය සිදු නො වේ. එබැවින් භාෂීය අර්ථාවබෝධය, භාෂීය සන්නිවේදනය හා සමඟ ඓන්ද්‍රීය ව බැඳී පවතින බව පෙනී යයි.

භාෂණ කාර්යය සේ ම අර්ථාවබෝධය නමැති කාර්යය නොහොත් අර්ථප්‍රතීතිය වූ කලී පූර්ණ වශයෙන් ම මනෝමූලික කාර්යයකි. භාෂාමය ශබ්දෝච්චාරණය හා අර්ථ නිෂ්පාදනය මෙන් ම එම අර්ථ වටහාගැනීම වාග්විද්‍යාවේ දී මූලික වශයෙන් අවධානයට ගැනේ. නූතන වාග්විද්‍යාවට අනුව භාෂාවේ සංස්ථිතිය වූ කලී ශබ්ද, පදිම, වාක්‍ය, අර්ථ හා උපයෝගීතා වශයෙන් මූලික ස්තර කිහිපයකින් සමන්විත වන අතර වාක්‍ය විචාරයට අනතුරු ව එන අර්ථ විචාරය මෙහි දී ඉතා වැදගත් වනුයේ එහි දී වාග්විද්‍යාත්මක සේ ම මනෝවිද්‍යාත්මක පදනමකින් ද යුතු ව භාෂීය අර්ථාවබෝධය පිළිබඳ විවරණය වන බැවිනි. පෙරදිග, භාරතීය භාෂාඥයන්ට අනුව, විශේෂයෙන් සංස්කෘත භාෂා ශාස්ත්‍රඥයන්ගේ ඉගැන්වීම්වලට අනුව ද අර්ථවිචාරය නොහොත් අර්ථාවබෝධය භාෂණ ක්‍රියාවලියෙහි ඉතා වැදගත් තැනක් ගන්නා බව පැහැදිලි වේ (බලගල්ලේ, 2014). භාරතීය භාෂාඥයන් මෙම ක්‍රියාවලිය "අර්ථප්‍රතීති" යනුයෙන් හඳුන්වා දී ඇත. අර්ථප්‍රතීතිය පිළිබඳ භාරතීය භාෂා විග්‍රහයෙහි දී ඉදිරිපත් ව ඇති ඉතා වැදගත් න්‍යායයක් ලෙසින් "ස්ඵෝටවාදය" හඳුනා ගත හැකි ය. එහි දී කිසියම් භාෂාමය ප්‍රකාශයක්, නොහොත් අඛණ්ඩ වූ ශබ්ද සන්තතියක් ශ්‍රවණය කිරීමත් සමඟ ශ්‍රාවකයාගේ මනසෙහි ස්ඵෝට ජනනය වීම හා ඒ ඔස්සේ අර්ථප්‍රතීතිය සිදුවන ආකාරය මනෝ-වාග්විද්‍යාත්මක අර්ථයෙන් යුතු ව මැනැවින් විග්‍රහ වී තිබේ. මේ පිළිබඳ ඉතා පරිපූර්ණ විග්‍රහයක් ඇතුළත් වන්නේ භර්තෘහරී ගේ ''වාක්‍යපදීය'' කෘතියෙහි දී ය (Pillai, 1971). අප වාක්‍යයක් ශ්‍රවණය කිරීමේ දී සිදු වන්නේ කුමක් ද සහ එසේ කිසියම් අඛණ්ඩ ශබ්ද සන්තතියක් ශ්‍රවණය කළ පසු අර්ථප්‍රතීතිය සිදු වන්නේ කෙසේ ද යන කරුණු භර්තෘහරීගේ විග්‍රහයට හසු ව ඇත. මෙම පර්යේෂණය සීමා වන්නේ ස්ඵෝට සිද්ධාන්තය හා වාක්‍යයෙහි අර්ථප්‍රතීතිය හා සම්බන්ධ ව එහි දැක්වෙන විග්‍රහය පිළිබඳ අධ්‍යයනය උදෙසා ය. ස්ඵෝට සිද්ධාන්තය සහ වාක්‍යාගත අර්ථ විචාරය සම්බන්ධයෙන් පවත්නා ප්‍රාමාණික වූ ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය පදනම් කොට ගනිමින්, වාක්‍යයක් ශ්‍රවණය කිරීමේ දී අර්ථප්‍රතීතිය සිදු වන ආකාරය ගවේෂණය කිරීම පර්යේෂණයෙහි මූලික අරමුණ වේ.

භාෂණය යනු ප්‍රායෝගික සංසිද්ධියකි. මනුෂ්‍යයාගේ කවරාකාර කටයුත්තක දී වුව ද භාෂාව ප්‍රමුඛ වේ. මානව සන්නිවේදනය නමැති කාර්යයෙහි අද්විතීය උපකරණය භාෂාව වන අතර එහි ඉෂ්ටාර්ථය අර්ථ පරිවහනය යි. භාෂාව භාවිත කිරීමත්, භාෂාමය අර්ථාවබෝධයත් නිරන්තරයෙන් සිදු කෙරුණ ද එහි පවත්නා ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනවල දී බොහෝ විට එය බටහිර ලෝකය විසින් ගොඩනැගුණු අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙසින් ඉස්මතු කෙරෙනු දැකිය හැකි වේ.

වෛදික, උපනිෂද් සාහිත්‍යාගත ව ප්‍රාරබ්ධ වී වර්ධනය වූ පොහොසත් සාහිත්‍යයකට හිමිකම් ඇති සංස්කෘත සාහිත්‍ය විචාරය හා ව්‍යාකරණ දර්ශනයෙහි දී අර්ථවිචාරයෙහි පමණක් නොව, සෙසු වාග්විද්‍යාත්මක අධ්‍යයන ක්ෂේත්‍රවල දී ද අධ්‍යයනය කෙරෙන සංකල්ප මැනැවින් විග්‍රහ වී තිබෙනු දැකිය හැකි වේ. එවැනි දාර්ශනික වූ අධ්‍යයන සංහිතාවක ලේශ මාත්‍රයක් පමණක් වූ වාක්‍යයක අර්ථප්‍රතීති ක්‍රියාවලිය පිළිබඳ ගවේෂණය කෙරෙන මෙම පර්යේෂණය මඟින් භාරතීය වාග්විද්‍යාත්මක දර්ශනයෙහි වැදගත්කම ප්‍රකට කෙරේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කෙරුණු මෙම පර්යේෂණයෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් භර්තෘහරීගේ වාක්‍යපදීයෙහි එන ස්ඵෝට සිද්ධාන්තය හා වාක්‍යයෙහි අර්ථ ප්‍රතීතිය පිළිබඳ විචාරාත්මක ව මෙන් ම දාර්ශනික ව අධ්‍යයනයට ලක් වී ඇති, මහානාම කරුණාරත්නගේ "Theoretical Significance of the *Sphoṭa* Doctrine" (1985) නමැති ලිපිය සහ රෝහණ සෙනෙවිරත්නගේ **සංස්කෘත ව්‍යාකරණ දර්ශනයේ පැනෙන ස්ඵෝට සිද්ධාන්තය** (2005) යන ශාස්ත්‍රවේදී උපාධි නිබන්ධය පාදක වූ අතර ස්ඵෝටවාදය, අර්ථ විචාරය (semantics) සහ සංඥාර්ථවේදය (semiotics) පිළිබඳ න්‍යායික, සනිදර්ශනාත්මක විවරණ සහිත ග්‍රන්ථ සහ ශාස්ත්‍රීය ලිපි ද්විතීයික මූලාශ්‍රය වශයෙන් උපයුක්ත කොට ගැනුණි. ස්ඵෝට සිද්ධාන්තය හා අර්ථ විචාරය පිළිබඳ එම මූලාශ්‍රයාගත විමර්ශන මත පදනම් ව ''වාක්‍යයක අර්ථප්‍රතීති ක්‍රියාවලිය'' පිළිබඳ විශේෂයෙන් පරීක්ෂා කිරීම මෙහි දී සිදු කෙරේ.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 අර්ථවිචාරය

අර්ථවිචාරය (Semantics) යනුයෙන් හඳුනා ගැණෙනුයේ කිසියම් භාෂාවක වචනවල සහ වාක්‍ය ඛණ්ඩවල (phrases) අර්ථය පිළිබඳ ව සිදු කෙරෙන අධ්‍යයනය යි. සෑම භාෂාවක් ම අර්ථවත් වූ අදහස් ප්‍රකාශනයෙහි මූලාශ්‍රයකි. භාෂාවක ව්‍යූහය මඟින් මනුෂ්‍යයාගේ මනසෙහි පවත්නා අර්ථ ප්‍රකාශනීයත්වයට පත් කිරීම සිදු වේ. භාෂාවක භාෂණ හා ලේඛන විධි ඔස්සේ අදහස් නොහොත් අර්ථ පරිවහනය කිරීම සිදු කෙරේ. ඇතැම් විට භාෂාමය නොවන අභිනය, හැසිරීම් ආදිය ඔස්සේ ද අර්ථ අනාවරණය කෙරේ. ශබ්දවිචාරයෙහි (phonology) දී භාෂාවේ ශබ්ද රටා පිළිබඳ අධ්‍යයනය කෙරේ. පදිම විචාරයේ (morphology) දී සහ වාක්‍ය විචාරයේ (syntax) දී පිළිවෙළින් වචනවල සහ වාක්‍යවල ක්‍රමික සංවිධානය පිළිබඳ අධ්‍යයනය කෙරේ. මෙකී සියලු ම අවස්ථා අපගේ මනසෙහි ඇතිවන අර්ථවත් පණිවුඩ පරිවහනය සහ ග්‍රහණය කරගැනීමේ භාෂාමය ක්‍රියාවලිය හා බැඳී පවතී.

අර්ථවිචාරය යනුයෙන් හැඳින්වෙන "Semantics" නමැති පාරිභාෂික පදයෙහි නිරුක්ත්‍යර්ථය වෙත අවධානය යොමු කිරීම මෙහි දී වැදගත් වේ. Semantics යන වචනය ප්‍රාරබ්ධ වී ඇත්තේ *Semantique* යන ප්‍රංශ වචනයෙනි. එම ප්‍රංශ වචනය, සංඥා කිරීම, හැඟවීම (Signify) යන අර්ථය ගෙනදෙන *Semaino* යන වචනයෙහි සහ සංඥාව (Sign) යන අර්ථය ගෙනදෙන *Sema* යන වචනයෙහි ගුණාර්ථය හා සම්බන්ධ වේ. එබැවින් Semantics යන්න Significant නොහොත් අර්ථය හා සමඟ සම්බන්ධ වන බව පැහැදිලි ය (Prasad, 2008).

තවත් ආකාරයකින් විවරණය කළහොත්, අර්ථවිචාරය (semantics) යනු,

1. ප්‍රඥප්ත (referents/names) සහ ප්‍රඥප්තක (referends/things) අතර පවත්නා සම්බන්ධය සමඟ,
2. වාග්විද්‍යාත්මක ස්තර (වචන, ප්‍රකාශන සහ වාක්‍යාංශ) සහ ඒවා මඟින් විමර්ශනය කෙරෙන අරමුණු, සංකල්ප හෝ අදහස් සමඟ

සම්බන්ධ වාග්විද්‍යාත්මක අංශයක් ලෙසින් හඳුනා ගත හැකි ය.

භාෂාවෙහි ආවශ්‍යයික අංශය ලෙසින් "අර්ථය" හඳුනා ගත හැකි ය. භාෂාවක ඉෂ්ටාර්ථය වනුයේ අර්ථවත් වූ පණිවිඩයක් පරිවහනය සහ ග්‍රහණය කරගැනීම යි. සන්නිවේදනයෙහි මූලික ම උපකරණය වන භාෂාවෙහි කාර්යය එය යි. භාෂාවක ව්‍යූහය මඟින් මනුෂ්‍යයාගේ මනසෙහි පවත්නා අර්ථ ප්‍රකාශනීයත්වයට පත් කිරීම සිදු වේ. මෙහි දී භාෂාවේ ව්‍යූහය (Structure of the Language) වැදගත් වේ. භාෂාවෙහි පවත්නා ප්‍රධාන අර්ථෝද්පාදක තලය ලෙසින් වාක්කෝශීය හා ව්‍යාකරණ අර්ථය (Lexical and Grammatical Meaning) හඳුනා ගත හැකි ය. වාක්කෝශීය සහ ව්‍යාකරණාර්ථයෙන් පමණක් වටහා ගත නොහැකි විශේෂ ප්‍රකරණයන්හි දී ද අර්ථ නිෂ්පත්තිය සිදු වන අවස්ථා ද මානව භාෂාවෙහි දක්නට ලැබීම විශේෂ වේ. එවැනි තත්ත්ව නූතන වාග්විද්‍යාවෙහි දී ''ආවස්ථික ප්‍රකරණ න්‍යායය'' (The Theory of Situational Context) යටතේ අධ්‍යයනය කෙරේ. කිසියම් පදයක් හෝ වාගාලාපයක් වාක්‍යයක යෙදීමේ දී එය අයත් සමාජ ප්‍රකරණය සම්බන්ධයෙන් ද සලකා බැලිය යුතු බව ආවස්ථික ප්‍රකරණ න්‍යායෙහි පිළිගැනීම යි (බලගල්ලේ, 1985). නිදසුනක් වශයෙන් "බල්ලා" නමැති වාක් සංඥාව පොදුවේ සිංහල භාෂක සමාජයෙහි ප්‍රකරණ කිහිපයක දී විවිධ අර්ථ සහිත ව භාවිත වන ආකාරය දැක්විය හැකි ය.

1. සුනඛයා නමැති සත්ත්වයා සූචනය කිරීම සඳහා යෙදීම
2. "බයිසිකලයේ බල්ලෝ අල්ලන්නේ නෑ" වැනි කථන ව්‍යවහාරයෙහි එන වාගාලාපයක දී පාපැදියෙහි එන තාක්ෂණික උපාංගයක් එයින් අර්ථවත් වේ
3. "මිනිහා කළගුණ නොදන්නා බල්ලෙක්" වැනි අවලාදාත්මක ප්‍රකාශනයක දී දුර්ගුණ සහිත පුද්ගලයකු පිළිබඳ හැඟවීමෙහි යෙදේ

ඉහත එක් එක් අවස්ථාවේ දී "බල්ලා" යන වාක් සංඥාවට පවතින්නේ විවිධ අර්ථ වේ. එය යෙදී ඇති වාක්‍යාර්ථය වටහාගැනීම උදෙසා කෝශාර්ථය හෝ ව්‍යාකරණාර්ථය පමණක් ප්‍රමාණවත් නො වේ. අදාළ වාක්‍යය යෙදෙන සමාජීය ප්‍රකරණය ද දැන සිටීම හා ඒ පිළිබඳ අනුභූතීන්ගෙන් සමන්විත වීම අවශ්‍ය වේ.

අර්ථය යනු භාෂාවක ආත්මය යි. මූලික ව භාෂාවක් යනු වචන (ශබ්ද) හෝ වාක්‍ය ඔස්සේ සංකල්ප ප්‍රකාශනයකි. නිවැරදි ලෙසින් සංකල්පයක් ප්‍රකාශ කිරීමට නම් වාක්‍යය ව්‍යාකරණානුකූල විය යුතු ය. සෑම වචනයක් ම අර්ථවත් ඒකකයකි. භාෂාව යනු සංඥා පද්ධතියක් වන බැවින් එහි එන වාක් සංඥා සෑම විට ම කිසියම් වූ සම්මුතික, සංස්කෘතික, හිතුමතික සහ ආරෝපිත අර්ථයක් දරන බව සංඥාර්ථවේදය පිළිබඳ ප්‍රථමයෙන් ම වාග්විද්‍යාත්මක ප්‍රවේශයකින් විග්‍රහ කළ ෆර්ඩිනන්ඩ් ඩී සොසුය්යෝ දක්වන මූලික අදහස යි (Saussure, 1960).

සොසුය්යෝට අනුව, භාෂාවක සෑම වචනයක් ම, සෑම වාක් සංඥාවක් ම අර්ථයක් රැගෙන යන වාහකයකි. එම අර්ථය හා වාක් සංඥාව අතර ඇති සම්බන්ධය ආරෝපිත වූවක් බව මෙන් ම එම

සම්බන්ධය නෛසර්ගික (inherent) සම්බන්ධයක් නොවන බව ද පැහැදිලි ය. එසේ වුව ද "කිසිදු වචනයකට ඇත්තේ එක් (සජාතීය) සරල අර්ථයක් පමණක් නොවන බැවින් භාෂාවේ වචන මගින් පුරුද්දක් ලෙස නොහොත් ඇබ්බැහියක් ලෙස (habitually) රැගෙන යනු ලබන අර්ථය කිසි විටෙකත් වචනවලින් මුළුමනින් ම වෙන් කිරීම සිදු කළ නො හැකි ය" (Hawkes, 1977, p.64). අර්ථවිචාරයෙහි දී අවධානය යොමු කෙරෙනුයේ මෙකී "අර්ථය" කෙරෙහි ය. වාක් සංඥා සහ අර්ථය අතර සම්බන්ධය නෛසර්ගික නොවුණ ද එවා සම්මුතියක් ලෙසින් භාෂක සමාජය විසින් පිළිගෙන අවසන් වන අතර එබැවින් කවර වචනයකට (වාක් සංඥාවකට) වුව ද නියමිත අර්ථයක් පවතී.

නිදසුනක් ලෙස, "කොටියා" යන වචනය ගතහොත් සිංහල භාෂක සමාජයේ අදාළ වාක් සංඥාවෙන් හැඟවෙන අර්ථයක් (සත්ත්වයකු පිළිබඳ අදහසක්) අන්තර්ගත වේ. එසේ ම,

කොටියා මිනිසකු මැරීය

යනුයෙන් ගත් කල්හි එය වාක්‍යයක් බවට පත් වන අතර එහි අර්ථය ග්‍රහණය කරගැනීම සඳහා වාක්කෝශය කෙරෙහි සේ ම විශේෂයෙන් ම භාෂාවේ වාක්‍ය රටා නිර්මාණය කෙරෙන ව්‍යාකරණ නීති-රීති පද්ධතිය කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වේ. ලිඛිත මෙන් ම කථන (භාෂණ) ව්‍යවහාර සඳහා ද කිසියම් ආකාරයක ව්‍යාකරණයක් පවතී. ව්‍යාකරණය යනු භාෂාව හසුරුවන රටාව යි. භාෂාවේ පවත්නා වචන ගොනුවලින් (නාමපද, ක්‍රියාපද ආදි වශයෙන්) වචන ගෙන කිසියම් පිළිවෙළකට, අර්ථයක් ලැබෙන පරිදි භාෂාව හසුරුවන රටා පද්ධතිය ව්‍යාකරණය බව පෙනී යයි. "වචන සමුද්දේශ කිරීම සිදු වන්නේ වාක්‍ය සහ ව්‍යාකරණ රටාවල අනුග්‍රහය මත වේ" (Whorf, 1956, p.259). කථන ව්‍යවහාරයට පවා කිසියම් ව්‍යාකරණයක් පවතී. ඒ අනුව,

කොටියා මිනිසකු මැරීය
කොටියා මිනිහෙක් මැරුවා

යන වාක්‍ය දෙක ම කිසියම් පිළිවෙළකට වචන ගොනු කිරීමෙන් ද විශේෂයෙන් ම කාලභේදය, පුරුෂ භේදය, විභක්ත්‍යර්ථ ආදිය ද අන්තර්ගත කොට ගනිමින් අර්ථයක් ඉදිරිපත් කරන බව පැහැදිලි ය. ඒ අනුව වාක්‍යයක අර්ථය ග්‍රහණය කරගනු පිණිස වාක්කෝශීය අර්ථය සේ ම ව්‍යාකරණාර්ථය ද අවශ්‍ය බව පෙනී යයි.

භාෂාවේ වාක් සංඥා මඟින් කිසියම් අර්ථයක් (වස්තුවක්, ද්‍රව්‍යයක්, සත්ත්වයෙක් හෝ සංකල්පයක්) හැඟවේ. බාහිර ලෝකයට අයත් වස්තුව හෝ දෙය හෝ පුද්ගලයා හෝ ආදි වශයෙන් ඇති දෙය ප්‍රඥප්තය (referent) වන අතර, ඒ පිළිබඳ අපගේ මනසෙහි ඇති සංකල්පය නොහොත් සංඥාව සමුද්දේශය (reference) වේ. මෙසේ බාහිර ලෝකයේ පවත්නා දෙය හඟවන සංඥාව නොහොත් සංකේතය වූ කලී වචනය වේ. ෆර්ඩිනන්ඩ් ඩී සොසුය්යෝගේ (Saussure, 1960) විග්‍රහය අනුව වාක් සංඥාවක් සූචකය (signifier) සහ සූචිතය (signified) යනුයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර සූචකය යනු භාෂාමය ශබ්ද රූපය නොහොත් වචනය වේ. සූචිතය යනු එම භාෂාමය ශබ්ද රූපය මඟින් හැඟවෙන භෞතික වස්තුව, සංකල්පය හෝ භාවය නොහොත් මූලික වශයෙන් අර්ථය යි. එවැනි සංඥාවලින් සැදුම් ලත් පද්ධතිය භාෂාව වේ. භාෂාව (පද, වාක්‍ය) මඟින් සිදු කෙරෙනුයේ මනුෂ්‍යයාගේ මනසේ පවත්නා, බාහිර ලෝකය පිළිබඳ අර්ථ ප්‍රකාශනීයත්වයට පත් කිරීම යි. මනසට එම බාහිර ලෝකය පිළිබඳ අර්ථ ප්‍රවේශ වනුයේ මූලික වශයෙන් "භාෂා උපාර්ජන" (Language Acquisition) ක්‍රියාවලියෙහි දී ය.

> භාෂා භාවිතයේ දී සිදු වනුයේ භාෂා රූප භෞතික වස්තු, සත්ත්වයන්, සංකල්ප, භෞතික සිදුවීම්, සත්ත්ව ක්‍රියා හා සම්බන්ධ කිරීමකි. එම සම්බන්ධතාව භාෂා අර්ථය ලෙස සැලකේ... මිනිස් මනස ලක්ෂ සංඛ්‍යාත වාක්කෝශයකින් පිරී පවතී. එම වාක්කෝශය භෞතික ලෝකයේ වස්තු, එම වස්තු ආශ්‍රිත සිදුවීම්, සත්ත්වයන්, සත්ත්ව ක්‍රියා, සංකල්ප ආදිය සමඟ සම්බන්ධ කිරීම ද නිරතුරු ව සිදු වේ. (වික්‍රමසිංහ සහ රාජපක්ෂ, 1999, 66-67)

වාක්‍යයක හෝ වාගාලාපයක අර්ථය ග්‍රහණය කරගැනීමේ දී එහි වාක්කෝශීය හා ව්‍යාකරණමය අර්ථය පමණක් සලකා බැලීම ප්‍රමාණවත් නො වේ. භාෂාව යනු සංස්කෘතික පරිවහනය සිදු කරන මාධ්‍යයකි. එහි වාක්කෝශීය හෝ සම්මුතික අර්ථය අබිබවා ගිය ප්‍රකරණාත්මක අර්ථ අන්තර්ගත වන අවස්ථා, උපභාෂා ප්‍රස්තර අන්තර්ගත වන අවස්ථා ආදි තත්ත්ව ඕනෑ තරම් දැකගත හැකි ය. නිදසුන් ලෙස භාෂාවේ එන රූඪී, ඉඟිවැකි, ආප්තෝපදේශ, උපමා-රූපක, ව්‍යංග්‍යාර්ථ ආදි යෙදුම් හඳුනා ගත හැකි ය. මේ ඔස්සේ පෙනී යන්නේ භාෂාවක අර්ථය යනු තනි, සජාතීය ප්‍රපංචයක් නොව, සංකීර්ණ හා බහුත්වයකින් යුක්ත වූ ක්‍රියාවලියක් බව යි. එසේ ම භාෂකයා හා ශ්‍රාවකයාගේ අධ්‍යාපන තත්ත්වය, වයස් මට්ටම්, සමාජ පසුබිම්, සංස්කෘතික පසුබිම්, භූගෝලීය විවිධතා ආදිය නොහොත් අනුභූති සහ සංස්කාර කෙරෙහි ද අර්ථවිචාරයේ දී අවධානය යොමු විය යුතු වේ.

ප්‍රකරණාර්ථය වටහාගැනීමට වාක්‍යයක යෙදෙන කේවල අවයවවල අර්ථය පමණක් ප්‍රමාණවත් නො වේ. සම්පූර්ණ වාක්‍යයෙහි ම සාරය එහි දී වැදගත් වේ. එක් එක් වචනය පමණක් වෙන වෙන ම ගැනීමෙන් සම්පූර්ණ වාක්‍යයක හෝ වාගාලාපයක අර්ථය සුබෝධනය කිරීම උගහට වේ. එසේ ම අපගේ මනසෙහි තැන්පත් ව පවත්නා නාමයන් සහ සංඥාවන්ගෙන් සමන්විත වාක්කෝශීය අර්ථ අබිබවා

ගිය සාරාර්ථ ආවස්ථික ප්‍රකරණයෙන් යුක්ත වූ වාක්‍යයක හෝ වාගාලාපයක තිබීම නිසැක ව ම සිදු වන්නකි. එය මානව භාෂාවේ පවත්නා විශිෂ්ට ලක්ෂණයකි.

අර්ථවිචාරයෙහි දී සම්පූර්ණ වාක්‍යය කෙරෙහි වැඩි වැදගත්කමක් හිමි වේ. "සංඛ්‍යා නොව, සමීකරණ සහ ශ්‍රිත සැබෑ ලෙස ම ගණිතයෙහි හරය වන්නේ යම් සේ ද වචන නොව, වාක්‍ය වනාහි භාෂණයෙහි සාරය වේ" (Whorf, 1956, p.258). එබැවින් භාෂාවේ අර්ථය වනාහි කේවල සම්බන්ධතාවක් හෝ එක් සජාතීය සම්බන්ධතාවක් නොවන අතර භාෂණය සහ එහි අංග අතර බහුත්වයකින් හා විවිධත්වයකින් යුතු වූ සම්බන්ධතා සමූහයකින් මෙන් ම සංස්කෘතික සහ භෞතික යන අංශ දෙකට ම අදාළ අංග සහ සංරචකවලින් ද සමන්විත වූවකි.

වාක්‍යය සහ අර්ථවිචාරය සම්බන්ධයෙන් නෝම් චොම්ස්කි දක්වා ඇති අදහස් ද මෙහි දී වැදගත් වේ. චොම්ස්කිගේ විග්‍රහය අනුව භාෂා උපාර්ජනය සහ අර්ථාවබෝධය මුළුමනින් ම මනෝමූලික ක්‍රියාවලියකි. චොම්ස්කි ඉදිරිපත් කළ "විශ්වීය ව්‍යාකරණය" (Universal Grammar), භාෂාව හා මනස අතර සම්බන්ධය පිළිබඳ විප්ලවීය අදහසකි (Chomsky, 2006). ඊට අනුව භාෂාව කුමක් වුවත්, ව්‍යාකරණය ග්‍රහණය කරගැනීමේ හැකියාව උපතේ සිට ම මිනිස් මොළය තුළ ගොඩනැගී ඇත. කුඩා දරුවකුට භාෂාවක් ඉගෙනීම සඳහා භාෂාවකට නිරාවරණය වීම පමණක් ප්‍රමාණවත් වන බව චොම්ස්කි පෙන්වා දෙයි. ඔහුගේ පිළිගැනීම වන්නේ, භාෂා උපාර්ජනය සඳහා මනුෂ්‍යයාට සහජ හැකියාවක් (innate ability) පවතින බවත්, භාෂාවේ මූලික ව්‍යූහයන් උපතේ සිට ම මිනිස් මොළයෙහි කේතනය වී ඇති බවත් ය (Chomsky, 2006). මෙම විශ්වීය ව්‍යාකරණ න්‍යාය අනුව සෑම භාෂාවකට ම පොදු (සමාන) වන නීති-රීති පද්ධතියක් (ව්‍යාකරණයක්) පවතී.

නිදසුන් : සෑම භාෂාවකට ම ප්‍රශ්නයක් ඇසීමට හෝ සෘණාත්මක අදහසක් ප්‍රකාශ කිරීමට ක්‍රමයක් ඇත.
සෑම භාෂාවකට ම ස්ත්‍රී-පුරුෂ භාවය හඳුනා ගැනීමට, අතීතයේ හෝ වර්තමානයේ දී සිදු වූ දෙයක් ප්‍රකාශ කිරීමට ක්‍රමයක් ඇත.

චොම්ස්කිගේ මෙම තර්කය අනුව, මනසෙහි සහජයෙන් ම පවත්නා මූලික ව්‍යාකරණ නීති-රීති සෑම භාෂාවකට ම එක හා සමාන නම්, කුඩා දරුවකුට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ මවු භාෂාව තේරුම් ගැනීම සහ භාෂාව නිෂ්පාදනය කිරීම සඳහා ඔහුගේ/ඇයගේ සම වයසේ පිරිස් අනුගමනය කිරීම පමණි. දරුවා වැඩෙන පරිසරය මත ඔහු හෝ ඇය භාවිත කරන්නේ කුමන භාෂාව ද යන්න තීරණය වුව ද ඕනෑ ම භාෂාවක් ඵලදායී ලෙස ඉගෙන ගැනීමට අවශ්‍ය උපාංග සමඟ දරුවා උපත ලබයි. "ජනක ව්‍යාකරණය" (Generative Grammar) පිළිබඳ අදහස ද මේ ඔස්සේ ඉදිරිපත් වූ අදහසකි. ඊට අනුව මනුෂ්‍යයාට සහජයෙන් ම උරුම වන භාෂාමය විභවතාව භාෂාවෙහි නිරවද්‍ය ව්‍යාකරණයට අදාළ රීති හැඩගස්වයි (Chomsky, 2002). භාෂා උපාර්ජනයට අදාළ අංග සහජයෙන් ම මිනිස් මොළයෙහි පවත්නා බැවින් අර්ථ ජනනය මෙන් ම අර්ථාවබෝධය ද ඒ ඔස්සේ සිදු වන බව මෙම සංකල්පය මගින් ඉස්මතු වේ.

වාක්‍යය සහ අර්ථවිචාරය සම්බන්ධයෙන් චොම්ස්කි ඉදිරිපත් කර ඇති වැදගත් ම සංකල්පය වන්නේ ''ජනක ප්‍රතියෝජන ව්‍යාකරණය'' (Generative Transformational Grammar) පිළිබඳ අදහස යි (Chomsky, 2002). භාෂණ ක්‍රියාවලියේ දී ප්‍රධාන වශයෙන් සිදුවන සංසිද්ධි තුනකි.

1. භාෂා නිෂ්පාදනය
2. ඉන්ද්‍රිය ගෝචර වීම
3. අර්ථාවබෝධය

භාෂාමය නිෂ්පාදනයට පූර්වයෙන් සිදු වන්නේ සිතිවිලි නිෂ්පාදනය යි. පසුව එය සම්පූර්ණ වාක්‍යයක්/වාගාලාපයක් බවට පත් වේ. වාක්‍යයක් ඉදිරිපත් කෙරෙනුයේ ශබ්දිම අනුපිළිවෙළක් අනුව ය. චොම්ස්කිගේ විග්‍රහය අනුව භාෂා නිෂ්පාදනය ආරම්භ වන්නේ වාක්‍ය මට්ටමින් ය. එහි පියවර තුනකි (Chomsky, 2002).

වාක්‍ය (syntax) → අර්ථය (semantics) → ශබ්ද ඒකක (phonetics)

අර්ථවිචාරයෙහි දී චොම්ස්කි ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ "වාක්‍යය" වෙත බව මේ අනුව පැහැදිලි වේ. භාෂකයාගේ මනසෙහි ජනනය වන අර්ථ, භාෂා නිෂ්පාදනයෙහි දී සම්පූර්ණ වාක්‍යයක්/වාගාලාපයක් බවට පත් වේ.

වාක්‍ය විචාරය සම්බන්ධයෙන් චොම්ස්කි ඉදිරිපත් කරන ජනක ප්‍රතියෝජන න්‍යාය අනුව මූලික වශයෙන් සිදු වන්නේ භාෂාවක සම්මත ව්‍යූහයට නොහොත් ව්‍යාකරණයට අනුකූල ව වාක්‍ය ව්‍යූහයන් පිළිබඳ අනන්ත විකල්ප සංඛ්‍යාවක් නිෂ්පාදනය කිරීම සඳහා වාක්‍යයක සංරචක වෙනත් සංරචක සමඟ ආදේශ කිරීම යි. එහි දී ප්‍රධාන ව්‍යූහ දෙකක් චොම්ස්කි හඳුන්වා දෙයි (Chomsky, 2002).

1. Deep Structure – ගැඹුරු ව්‍යූහය
2. Surface Structure – මතුපිට ව්‍යූහය

වාක්‍ය විචාරයෙහි දී, කථකයකුගේ මනසෙහි ඇති සෑම වාක්‍යයකට ම යටින් ගැඹුරු ව්‍යූහයක් මෙන් ම මනෝමූලික වාක්කෝශයක් (mental lexicon) ඇති බව පැවසීම සම්බන්ධයෙන් චොම්ස්කි වඩාත් ප්‍රසිද්ධියක් උසුලයි. එය ඔහුගේ විශ්වීය ව්‍යාකරණය

පිළිබඳ අදහස හා සම්බන්ධ වේ. චොම්ස්කි පවසන පරිදි, වාක්‍යයක් තේරුම් ගැනීමට වාක්‍යය පිළිබඳ එක් එක් වාග්විද්‍යාත්මක මට්ටමේ විශ්ලේෂණවලට වඩා බොහෝ දේ අප දැන සිටිය යුතු ය. වාක්‍යය සැකසී ඇති පදිම හෝ වචනවල සමුද්දේශය (reference) සහ අර්ථය ද දැන සිටිය යුතු ය. වාක්‍යයක් තේරුම් ගැනීම සඳහා ස්වාභාවික ව ව්‍යාකරණය පමණක් මෙහි දී උපකාර වේ යැ යි බලාපොරොත්තු විය නොහැකි අතර මෙම සංකල්ප අර්ථවිචාරය සඳහා විෂයය වන කරුණු සකසයි (Chomsky, 2002). මෙහි දී ගැඹුරු ව්‍යූහයෙහි අර්ථවිචාරය (semantics) හා සම්බන්ධ අංග ද මතුපිට ව්‍යූහයෙහි පදක-ශබ්දයෝග විචාරය (Morpho-phonemic) හා සම්බන්ධ අංග ද අන්තර්ගත වේ. මනසෙහි තැන්පත් ව පවත්නා සංකල්ප, සිතිවිලි, අදහස් සහ භාවයන් යනාදියෙන් සමන්විත අර්ථවිචාරාත්මක තලය ගැඹුරු ව්‍යූහය වන අතර වචනවලින් සමන්විත තලය එනම්, මූලික වශයෙන් භාෂාව මතුපිට ව්‍යූහය වේ. සරල ව පැවසුවහොත් ගැඹුරු ව්‍යූහය යනු "ප්‍රකාශ කිරීමට අවශ්‍ය අර්ථය" වන අතර මතුපිට ව්‍යූහය යනු ''භාෂාමය වශයෙන් එය ප්‍රකාශ කරන ආකාරය'' බව චොම්ස්කිගේ පුළුල් විග්‍රහය (Chomsky, 1979) අනුව දැක්විය හැකි ය. ව්‍යාකරණයක් වාක්‍ය විචාරාත්මක, අර්ථ විචාරාත්මක සහ ශබ්ද විචාරාත්මක යන තෙයාකාර අංගවලින් සමන්විත වන බවත්, අර්ථ විචාරාත්මක සහ ශබ්ද විචාරාත්මක අංග මුළුමනින් ම අර්ථකථනාත්මක අංග පමණක් වන අතර වාක්‍ය ව්‍යූහයන් ප්‍රත්‍යාවර්තී ලෙස උත්පාදනය (Recursive Generation) කිරීමේ දී ඒවා කිසිදු කාර්යයක් ඉටු නොකරන බවත් චොම්ස්කිගේ අදහස යි (Chomsky, 1965). එසේ ම වාක්‍ය විචාරය පාදකයක් සහ ප්‍රතියෝජනාත්මක (Transformational) අංගයකින් සමන්විත වන බව ද චොම්ස්කි මෙහි දී වැඩිදුරටත් පෙන්වා දෙයි. මෙහි දී පදනම නොහොත් පාදකය (base) ගැඹුරු ව්‍යූහ උත්පාදනය කරන අතර ගැඹුරු ව්‍යූහය අර්ථ විචාරය වෙත ප්‍රවේශ වී අර්ථවිචාරාත්මක අර්ථකථනයක් (සම්පූර්ණ අර්ථයක්) ලබා ගැනීම සිදු සිදු කරයි. එය ප්‍රතියෝජන රීති (Transformational Rules) මඟින් මතුපිට ව්‍යූහයක් බවට සිතියම්ගත කෙරෙන අතර පසුව එය පදක-ශබ්දයෝග විචාරාත්මක රීති ඔස්සේ අර්ථකථනය කිරීම ද සිදු වේ. මේ අනුව ව්‍යාකරණය මඟින් භාෂාවේ සංඥා වෙත අර්ථවිචාරාත්මක අර්ථකථන පැවරීම සිදු කරයි. මෙම සම්බන්ධය වෙත වාක්‍ය විචාරයෙහි ප්‍රතියෝජන රීති මඟින් මැදිහත්වීම සිදු වේ. ප්‍රතියෝජන ව්‍යාකරණය පිළිබඳ චොම්ස්කි ඉදිරිපත් කරන සාරාංශය එය යි (Chomsky, 1965). ප්‍රතියෝජන රීති පිළිබඳව චොම්ස්කි පුළුල් විග්‍රහයක් ඉදිරිපත් කර ඇති අතර, මූලික වශයෙන් ප්‍රතියෝජන රීති යනු භාෂාත්මක ව නිෂ්පාදනය වන මූලික (පාදක) වාක්‍යයක් (හෝ වාගාලාපයක්) ව්‍යූහමය වශයෙන් විවිධ වෙනස්කම්වලට (විපරිණාමයන්ට) භාජනය කරමින්, වෙනස් වූ අර්ථ දෙන වාක්‍ය සකසා ගැනීමේ ක්‍රියාවලිය සඳහා උපයුක්ත කොට ගනු ලබන රීති ලෙස හඳුනා ගැනීම මෙහි දී ප්‍රමාණවත් වේ. ලොප් කිරීම (deletion) නව අංග ඇතුළත් කිරීම (insertion) සහ පවත්නා අංග චලනය කිරීම (movement) එම ප්‍රතියෝජන රීතිවල මූලික අවස්ථා ලෙස මෙහි දී දැක්විය හැකි ය. ජනක ප්‍රතියෝජන ව්‍යාකරණය අනුව ගැඹුරු ව්‍යූහයෙහි සිට මතුපිට ව්‍යූහය දක්වා මෙම අංග විකාශනය වන ආකාරය විග්‍රහ කොට දැක්වේ.

නිදසුනඃ

පාදක වාක්‍යය - "කළු බල්ලා කුඩුව කඩාගෙන මිදුලට පැන්නා"


S (Sentence) – (පාදක) වාක්‍යය
NP (Noun Phrase) – නාම පාදය
Pred.P (Predicative Phrase) – ප්‍රදිෂ්ට පාදය
Q1- විස්තාරකය 1
N1 – නාමපදය 1
Q2 – විස්තාරකය 2
VP (Verb Phrase) – ක්‍රියා පාදය
N2 – නාමපදය 2
Pl (participle) – කෘදන්තය
N3 – නාමපදය 3 (විභක්ති ප්‍රත්‍යගැන්වුණු)
V – ක්‍රියාපදය

පාදක වාක්‍යයක් ගැඹුරු ව්‍යූහයෙහි සිට යථෝක්ත අංග වෙත එනම්, මතුපිට ව්‍යූහය වෙත විකාශනය වීම රුක් සටහනක් මඟින් හඳුනා ගත හැකි වේ (රූපසටහන 01).

මෙහි දී ඉහත සඳහන් වූ ප්‍රතියෝජන රීති භාවිත කරමින් "බල්ලා කුඩුවෙන් පැනලා මිදුලට දිව්වා" ආදි වශයෙන් පාදක වාක්‍යයක්, ව්‍යූහීය වශයෙන් වෙනස් කරමින් විවිධ අර්ථ සහිත වාක්‍ය ගණනාවක් ප්‍රතියෝජනය කිරීමේ හැකියාව පවතී. අර්ථවිචාරය හා වාක්‍ය විචාරය සම්බන්ධයෙන් චොම්ස්කි දක්වන මෙම අදහසෙහි ඉතා වැදගත් ම කරුණ වන්නේ භාෂාමය නිෂ්පාදනයෙහි මෙන් ම අර්ථවිචාරයෙහි ද මූලිකාංගය ලෙසින් වාක්‍යය සලකා තිබීම යි. අර්ථකථනාත්මක වශයෙන් වාක්‍යයක් ශබ්දිම ව්‍යූහය දක්වා විකාශනය කළ හැකි වුව ද අර්ථ නිෂ්පාදනයෙහි දී, අර්ථ සම්ප්‍රේෂණයෙහි දී, අර්ථය ග්‍රහණය කරගැනීමේ දී සහ අර්ථාවබෝධයෙහි දී සම්පූර්ණ වාක්‍යය සැලකිය යුතු බව චොම්ස්කිගේ යථෝක්ත අදහස්වලින් ගම්‍ය වන වැදගත් කරුණ වේ. වාක්‍ය ව්‍යූහය (Syntactic Structure) සහ අර්ථය අතර වැදගත් ස්වාභාවික සහසම්බන්ධයක් පවතින අතර එම සම්බන්ධතාවෙහි විවිධ වෙනස්කම් කිරීම සඳහා (විවිධ අර්ථ ඇති වන පරිදි වාක්‍ය ව්‍යූහය වෙනස් කිරීම සඳහා) ව්‍යාකරණමය අංග ක්‍රමානුකූල ව භාවිත කෙරෙන බව

චොම්ස්කිගේ විග්‍රහය ඔස්සේ පැහැදිලි වේ (Chomsky, 2002).

නූතන අර්ථවිචාරය සම්බන්ධයෙන් සිදු කෙරුණු යථෝක්ත විග්‍රහයට අනුව, අර්ථවිචාරයෙහි දී භාෂාවේ අර්ථ ජනන ක්‍රියාවලිය හා භාෂාවේ ඇති අංග ඒ කෙරෙහි දායක වන ආකාරය මෙන් ම අර්ථ ජනනය සහ අර්ථාවබෝධය යන ක්‍රියාවලි විෂයයෙහි මනුෂ්‍යයාගේ මනෝමූලික සංසිද්ධීන් ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න අවධානයට ගැනෙන බව හඳුනා ගත හැකි ය.




**රූපසටහන 1.** පාදක වාක්‍යයක් ගැඹුරු ව්‍යූහයෙහි සිට මතුපිට ව්‍යූහය වෙත විකාශනය වීම

### 3.2 ස්ඵෝටවාදය හා වාක්‍යයෙහි අර්ථප්‍රතීතිය

අර්ථ විචාරය හා සම්බන්ධයෙන් සලකා බැලීමේ දී නූතන අර්ථ විචාරය හා මැනැවින් ගැළපෙන සේ ඉදිරිපත් ව ඇති න්‍යායයක් ලෙසින් ක්‍රි.ව.06 වැනි සියවසෙහි දී භර්තෘහරී විසින් රචනා කරන්නට යෙදුණු "වාක්‍යපදීය" කෘතියෙහි එන අර්ථප්‍රතීතිය හා සම්බන්ධ විවරණය දැක්විය හැකි ය. එහි දී භර්තෘහරී උපයුක්ත කොට ගෙන ඇති ඉතා වැදගත් සිද්ධාන්තයක් ලෙසින් "ස්ඵෝටවාදය" හඳුනා ගැනීමට හැකි වේ. වාක්‍යයාගේ අර්ථප්‍රතීතිය සම්බන්ධයෙන් විග්‍රහ කරනු පිණිස භර්තෘහරීන් ස්ඵෝටවාදය මැනැවින් යොදා ගත්ත ද ස්ඵෝටවාදය නමැති මෙම වෛශේෂික න්‍යායය ඉන් පෙර සිට ම භාරතීය පෞරාණාචාර්යයන් ග්‍රහණය කොට ගෙන සිටි බව පෙනී යයි. "ස්ඵෝටායන" යන යෙදුම මුලින් ම භාවිත කළෝ, පාණිනීහු ය (Behera, 2015). ඒ ස්වකීය "අෂ්ටාධ්‍යායී" කෘතියෙහි දී ය. ඉන් අනතුරු ව සංස්කෘතයෙහි මහා නෛරුක්තාචාර්ය වන යාස්ක ස්වකීය "නිරුක්ති" කෘතියෙහි දී ද මෙම යෙදුම උපයුක්ත කොට ගෙන ඇත. සංග්‍රහ කර්තෘවර ව්‍යාඩීහු ද ප්‍රාකෘත ධ්වනි සහ විකෘත ධ්වනි අතර වෙනස විග්‍රහ කිරීමේ දී ස්ඵෝටවාදය උපයුක්ත කොට ගෙන ඇත. එසේ ම කාත්‍යායන, පතඤ්ජලී වැනි සංස්කෘත පඬිවරු ද භර්තෘහරීට පෙර ස්ඵෝට සිද්ධාන්තය උපයුක්ත කොට ගත්හ (සෙනෙවිරත්න, 2005).

වාක්‍යපදීය ප්‍රාරම්භයෙහි දී ම භර්තෘහරී සඳහන් කරනුයේ, "බ්‍රහ්මන් වන සදාකාලික ශබ්ද තත්ත්වය වචන බවට පත් වී අර්ථ බවට පත්වන බව" යි.

අනාදිනිධනං බ්‍රහ්ම ශබ්දතත්ත්වං යදක්ෂරම්
විවර්තතෙ'ර්ථභාවේන ප්‍රක්‍රියා ජගතො යතඃ (Pillai, 1971, p.01)

මෙහි දී භර්තෘහරී පවසා ඇති පරිදි ප්‍රපංච ලෝකයේ සියලු දේහි මූලය වන්නේ බ්‍රහ්මන් හා සම වූ මෙම ශබ්ද තත්ත්වය යි.

පැරණි ශබ්ද ශාස්ත්‍රයට අනුව වචනයක අවස්ථා කිහිපයක් දැකගත හැකි ය. සංස්කෘත ශබ්ද විද්‍යාවේ විශේෂ අංගයක් වූ ස්ඵෝටවාදය මේ අවස්ථා විග්‍රහය අනුව ඇති වූවකි (ගුනසිංහ, 1986). භර්තෘහරීගේ යථෝක්ත විග්‍රහයට අනුව "බ්‍රහ්මන්" හා සම වූ සදාකාලික ශබ්ද තත්ත්වය වචන බවට පත් වී අර්ථ බවට පත් වන බව පැවසීම ඒ මත පිහිටා ගොඩනැගූ තර්කයකි. ව්‍යාකරණ විභාගයෙහි දී අර්ථයෙන් වෙන් වූ ශබ්ද වෙත අවධානය යොමු කිරීමේ අවකාශය පැවතුණ ද අර්ථයකින් තොර වචනයක් හෝ වචනයකින් තොර ව බිහිවන අර්ථයක් හෝ නොමැති බව, "ඥානය මුළුමනින් ම භාෂාමය ශබ්ද හා ඒකාත්මික ව පවතී" යනුයෙන් භර්තෘහරී ඉස්මතු කරයි.

න සො'ස්ති ප්‍රත්‍යයො ලොකෙ යඃ ශබ්දානුගමාදෘතෙ
අනුවිද්ධමිව ඥානං සර්වං ශබ්දෙන භාසතෙ (Pillai, 1971, p.28)

> අදහස : මෙලොව භාෂණයෙන් තොර වූ අවබෝධයක් ලද නො හැකි ය. සියලු ඥානය බබළනුයේ භාෂණය මඟින් පතුරුවනු ලබන ආකාරයෙනි.

භර්තෘහරී ඉදිරිපත් කරන වාක්‍යයාගේ අර්ථප්‍රතීතිය හා සම්බන්ධ විග්‍රහය සඳහා ස්ඵෝට සිද්ධාන්තය මූලික වී ඇත. ඒ පිළිබඳ අනුක්‍රමික ව හඳුනා ගැනීම මෙහි දී වැදගත් වේ.

> 'ස්ඵෝට' යන්නෙහි නිරුක්තිය වශයෙන් 'පුපුරා යාම' හෙවත් 'ස්ඵෝටනය' යන අරුතින් යුතු '√ස්ඵුට්' ධාතුව සැලකෙයි. මෙම ප්‍රකෘතියෙන් ම 'ස්ඵෝටක, ස්ඵෝට(නී), ස්ඵෝටා, ස්ඵුටි' යනාදි පද රාශියක ම සිද්ධිය වෙයි. මෙම පද සංස්කෘත භාෂාවේ විවිධ, විචිත්‍ර අර්ථයන්හි යෙදෙයි. ප්‍රස්තුතයට අදාළ අර්ථවිද්‍යාත්මක වටිනාකමින් යුතු 'ස්ඵෝට' යන පදයේ සිද්ධිය පැහැදිලි කෙරෙන්නේ 'ස්ඵුට් කරණෙ ඝඤ්' යන සූත්‍රානුසාරයෙනි. '√ස්ඵුට්' යන ප්‍රකෘතිය ආකාර දෙකකින් විග්‍රහ කරනු ලැබ තිබේ.
>
> ස්ඵෝටය එහි වාග්වෛෂයික අරුතින් ගත් කල, 'පිපිරීමක්' නොහොත් 'බැබළීමක්' වශයෙන් අර්ථය හෙළි කරන්නේ ය යනු එක් ආකාරයක විග්‍රහයකි. හෙවත් ස්ඵෝටය 'වාචක' යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. 'ස්ඵෝටවාදය' නම් සාරසංග්‍රහයේ කර්තෘභූත නාගේශභට්ට දක්වන අයුරින් ඒ මෙසේ ය. "තත්‍ර ස්ඵුටති ප්‍රකාශතෙ'ර්ථො'තෙන වාස්මාදිති ස්ඵොටඃ, වාචක ඉති යාවත්." ස්ඵෝටය වර්ණයන් මඟින් ආවිර්භවනය වන්නක් වශයෙන් විග්‍රහ කිරීම දෙවන ආකාරය යි. හෙවත් ස්ඵෝටය එහි අර්ථාභිවාහක අරුතින් ගතහොත් හුදු වාග්වෛෂයික සංඥාවකට වඩා වැඩි යමක් නො වේ. සර්වදර්ශනසංග්‍රහයෙහි දී මාධවාචර්යයන්ගේ විවරණය නිදසුනකි. ''අථ එව ස්ඵුටභතෙ ව්‍යජ්‍යතෙ වර්ණෛරිති ස්ඵොටො වර්ණාභිව්‍යංග්‍යඃ, ස්ඵුටති ස්ඵුටීබවත්‍යස්මාදර්ථ ඉති ස්ඵොටො'ර්ථප්‍රත්‍යායක ඉති ස්ඵොටශබ්දාර්ථමුබයථා නිරාහුඃ...'' මෙම දෙවන ආකාරයේ නිර්වචනය ස්ඵෝටවාදීන්ට බෙහෙවින් රුචි වූ බව පෙනේ (සෙනෙවිරත්න, 2005, 19).

නූතන අර්ථවිචාරය හා සමපාත කළ හැකි මට්ටමේ දියුණු අර්ථ ප්‍රතීති විවරණයක් ඉදිරිපත් කළ භර්තෘහරී විසින් දක්වා ඇති ඉතා වැදගත් අදහසක් වන්නේ අර්ථප්‍රතීතියෙහි ලා වාක්‍යය වාක්‍යයක් වශයෙන් ම නොහොත් සංගෘහිත ඒකකයක් ලෙස මුළුමනින් ම ගනු මිස, වාක්‍ය, පද වශයෙන් හෝ පද වර්ණ වශයෙන් හෝ වර්ණ-වර්ණාවයව (=ශබ්ද) වශයෙන් හෝ ව්‍යූහීය ව ඛණ්ඩනය කළ නො හැකි බව යි.

පදෙ න වර්ණා විද්‍යන්තෙ වර්ණෙෂ්වවයවා න ච
වාක්‍යාත් පදානාමත්‍යන්තං ප්‍රවිවෙකො න කශ්චන (Pillai, 1971, p.15)

භර්තෘහරී මෙහි දී මතු කොට දක්වන මූලික අදහස වන්නේ වාක්‍යය වූ කලී භාෂාවේ වැදගත් ම ඒකකය වන අතර භාෂාවෙහි සෙසු කුඩා කොටස්වලට අඩු අවධානයක් ලැබිය යුතු බව යි. මෙම තර්කය වාග්විද්‍යා විෂයයෙහි ලා ඉතා ඵලදායී ප්‍රකාශයක් වන අතර වර්තමාන වාග්විද්‍යාඥයන්ගේ අවධානය ද ඊට ලැබිය යුතු බව නූතන වාග්විද්‍යාඥයන්ගේ මතය යි (De Silva, 1964). මේ අනුව භර්තෘහරී අර්ථප්‍රතීතිය හා සම්බන්ධයෙන් සලකා බලන, භාෂාවේ මූලික ම හා වැදගත් ම ඒකකය වන්නේ වාක්‍යය යි. එනම්, වාක්‍යයක් ගොඩනැගීමේ දී භාෂාවේ කේවල අවයව එක් වීම සිදු වුව ද භාෂණයට අදාළ අර්ථොද්ග්‍රහණය සිදු වන්නේ වාක්‍යයක කේවල අවයව වෙන් වෙන් වශයෙන් ගැනීමෙන් නොව, සමස්ත වාක්‍යය ම ශ්‍රවණය කොට අවබෝධ කොට ගැනීමෙනි. එනම්, වාක්‍යයෙහි කේවල අවයවල මනා වූ ගැළපීම ඔස්සේ ගොඩනැගුණු අදාළ ප්‍රකාශයෙහි සමස්ත හැඟීම ග්‍රහණය කොට ගැනීම අර්ථාවබෝධයෙහි දී සිදු වේ. වාක්‍ය විචාරය සම්බන්ධයෙන් චොම්ස්කි දක්වන අදහස අනුව ද පදක-ශබ්දයෝගමය අංග හුදෙක් අර්ථකථනමය වශයෙන් වැදගත් වන අවස්ථා වේ (Chomsky, 1965). අර්ථවිචාරය සඳහා පාදක වන්නේ වාක්‍යය යි. කෙසේ වුව ද වාක්‍යයක්

ගොඩනැගීමට භාෂාමය අවයව අනවශ්‍ය බව ඉන් අදහස් නො වේ.

ස්ඵෝටය සම්බන්ධයෙන් සෙසු භාරතීය තත්ත්වඥයන් විසින් විග්‍රහ කොට ඇති ආකාරය සම්බන්ධයෙන් ද මෙහි දී දළ වශයෙන් කියැවීමක් සිදු කොට ගැනීම වැදගත් වේ. කේවල ශබ්දයක් (වර්ණ) හඳුන්වනු පිණිස පවා "පතඤ්ජලී" ස්ඵෝට යන්න යොදයි. ස්ඵෝටය යනු, පතඤ්ජලීය මතයට අනුකූල ව දක්වතොත්, කේවල වර්ණයක් වශයෙන් හෝ, ශබ්ද ඒකක පරම්පරාවක් ලෙස විශ්ලේෂණය කරනු ලැබිය හැකි වර්ණ සමුදායක් වශයෙන් හෝ ගැනෙන ශබ්ද ඒකකයක් බව පෙනේ. ස්ඵෝටයේ සාමාන්‍යයෙන් නිශ්චිත විශාලත්වයක් ඇත (සෙනෙවිරත්න, 2005). පාණිනී ස්ඵෝටය පිළිබඳ ව දක්වන්නේ, අර්ථය දරන්නා වූ අභේද්‍ය, කේවල වාක්‍ය සංඥයක් වශයෙන් නොව, ස්ථාවර ශබ්ද ඒකකයක් වශයෙනි. මේ අනුව භාෂාව සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ස්ඵෝටය යනුයෙන් සරල ව හඳුනා ගත හැකි වනුයේ අර්ථවාහක ගුණයෙන් යුක්ත වූ කිසියම් වාඞ්මය සංඥාවක් බව පැහැදිලි වේ. භාෂකයා විසින් උච්චාරණය කරනු ලබන භාෂණමය ශබ්ද හෝ වාක්‍ය හෝ වාගාලාප හෝ වශයෙන් එන කවරකින් වුව ද ශ්‍රාවකයා වෙත අර්ථවාහකමය කාර්යය ඉටු කරනුයේ ස්ඵෝට විසින් වන අතර භාෂණ ක්‍රියාවලියෙහි දී සිදු වන්නේ එවැනි ස්ඵෝටන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වීමෙන් ස්ඵෝටනයට නොහොත් පිපිරීමට හෝ උද්දීප්තියට පත් වන්නා වූ මෙම අර්ථවාහක, අනුක්‍රමණික අංශු පරම්පරාව ශ්‍රාවකයාගේ මනේන්ද්‍රියෙහි තැන්පත් ව ක්ෂණයෙන් මුහුකුරා යැමෙන් අර්ථාවබෝධය සංසිද්ධ වීම යි. භාෂණ ශබ්ද ඔස්සේ අර්ථ රැගෙන යන අර්ථවාහක අංශු වන ස්ඵෝට, ශ්‍රාවකයාගේ මනසෙහි තැන්පත් ව මුහුකුරා ගොස් අර්ථප්‍රතීතිය සිදු කරයි. එබැවින් මෙය භෞතික ක්‍රියාවලියකින් එපිටට ගිය මනෝමූලික ක්‍රියාවලියක් බවත්, අර්ථ සංජානනය පිළිබඳ මෙවැනි සංකීර්ණ වූ ක්‍රියාවලියක් මීට සියවස් ගණනාවකට පෙරාතුව විසූ පුරාණ භාරතීය ව්‍යාකරණඥයන් සහ භාෂාඥයන් මැනැවින් විග්‍රහ කොට ඇති බවත් පැහැදිලි වේ. එහි දී පතඤ්ජලී, පාණිනී ආදි පෞරාණික ව්‍යාකරණඥයන්ගේ ආභාසය ද ලබමින්, භර්තෘහරී වාක්‍යය මූලික කොට ගනිමින් ඉදිරිපත් කරන අර්ථවිචාරාත්මක ව්‍යාකරණ දර්ශනය උත්කෘෂ්ට ස්ථානයක් හිමි කොට ගෙන ඇත.

"ස්ඵෝට යන්න කිසියම් භාෂාවක සියලු අර්ථවත් වාගාලාපයන්ට යටින් පවත්නා වාග්විද්‍යාත්මක ඒකකය වන අතර ම එය කිසියම් භාෂාවක ශබ්දවිද්‍යාත්මක ව්‍යූහය මඟින් නිරූපණය කෙරෙන බව හඳුනා ගත හැකි ය" (Karunaratne, 1985, p.57). මේ අනුව ස්ඵෝට යන්න භාෂාමය වශයෙන් විශ්වීය ඒකකයකි. භර්තෘහරී, වාක්‍යයෙහි විවිධ ස්වරූප පිළිබඳ විග්‍රහ කිරීමේ දී වාක්‍යාර්ථ න්‍යාය පිළිබඳ ශික්ෂාවට අයත් අදහස් තුනක් ඉදිරිපත් කරයි. ඒ මෙසේ යි.

1. වාක්‍යය වූ කලී අභේද්‍ය (indivisible) ඒකකයකි
2. වාක්‍යය, පොදු (generic) හෝ විශ්වීය (universal) අර්ථයක් නියෝජනය කරයි (ජාති)
3. වාක්‍යය, මනෝමූලික සංකල්පයකි (Karunaratne, 1985, p.57).

භර්තෘහරී දක්වන පරිදි මැනැවින් සකස් වුණු, ප්‍රාමාණික වාගාලාපයක සියලු වාක්‍යවිචාරාත්මක හා අර්ථවිචාරාත්මක තතු ස්ඵෝටයෙහි අන්තර්ගත වේ. "පක්ෂියෙකුගේ හෝ වෘක්ෂයක හෝ මනා සැකසුම පිළිවෙළින් බිත්තරයෙහි හෝ බීජයෙහි ජාති ලක්ෂණය වනවා සේ ම, වාගාලාපයක හොඳින් සැකසුණු භව්‍යතත්ත්වයන් ස්ඵෝට තුළ ඇති අතර, එබැවින් එය උත්පාදකත්වයෙන් යුක්ත වේ" (Karunaratne, 1985, p.58). චොම්ස්කි (2006) පවසන පරිදි ද සෑම භාෂාවකට ම පොදු වූ විශ්වීය ව්‍යාකරණයක් ඇත. චොම්ස්කිට සියවස් ගණනකට පෙර, උපනිෂද්හි ආලෝකය ද ලද භර්තෘහරීට අනුව වාක්‍යය පොදු, විශ්වීය අර්ථයක් නියෝජනය කරයි.

ස්ඵෝටයෙහි සියලු වාක්‍යවිචාරාත්මක හා අර්ථවිචාරාත්මක කරුණු අන්තර්ගත වුව ද එය වාගාලාපයන්හි අර්ථය නොව, අපරෝක්ත ව අර්ථය ගෙන දෙන්නා වූ අර්ථවාහකයා වේ. භර්තෘහරීට අනුව 'ශබ්ද' සහ 'අර්ථ' යනු භාෂාවේ වෙන් වෙන් ව පවත්නා ඒකක දෙකකි. 'අර්ථ' (ග්‍රහණය කරගනු ලබන් දෙය) යනු අර්ථය හෝ අර්ථවිචාරාත්මක අන්තර්ගතය වන අතර, අර්ථය දරන 'ශබ්ද' යනු වාගාලාපයෙහි යටින් පවත්නා ව්‍යූහය යි. ඒ අනුව භර්තෘහරීගේ විග්‍රහය ඔස්සේ භාෂාවේ අන්තර්ගත මූලික සංරචක තුනක් හඳුනා ගත හැකි ය (Karunaratne, 1985).

1. අර්ථ - අර්ථය නොහොත් අර්ථවිචාරාත්මක අන්තර්ගතය
2. ශබ්ද - මතුපිටින් යට පවත්නා ව්‍යූහය
3. ධ්වනි - ශබ්ද විද්‍යාත්මක ව්‍යූහය

මෙකී සංකල්ප අතර පවත්නා වූ සම්බන්ධය දෙයාකාර වේ.

1. 'අර්ථ' සහ 'ශබ්ද' යනු පිළිවෙළින් 'වාච්‍ය' සහ 'වාචක' වේ. එනම්, 'වාහකය' සහ 'වාහකයා' (conveyed and the conveyer) වේ.
2. 'ශබ්ද' සහ 'ධ්වනි' යනු පිළිවෙළින් 'ව්‍යංග්‍ය' සහ 'ව්‍යඤ්ජක' වේ. එනම්, 'ප්‍රකට වන දෙය' සහ 'ප්‍රකට කරන්නා' (revealed and the revealer) වේ.

අර්ථය නොහොත් අර්ථවිචාරාත්මක අන්තර්ගතය සහ යටිපෙළ ව්‍යූහය අතර සම්බන්ධය භර්තෘරී විසින්

විශේෂීකරණය කරන ලද්දක් නො වේ. එහෙත් පෘෂ්ඨීය ශබ්දවිද්‍යාත්මක ව්‍යූහය මත ස්ඵෝට අනුරූපණය (සිතුවම්) වන්නේ කෙසේ ද යන්න පිළිබඳ හෙතෙම ප්‍රාමාණික විවරණයක් සැපයීමට සමත් ව තිබේ.

> ස්ඵෝට යන්න සිතුවම්කරුවෙකුගේ මනසෙහි ඒකාත්මික ව ප්‍රත්‍යක්ෂ වූ සිතුවමක් වැනි ය. ඔහු මෙය සිතුවම් කිරීම නිශ්චිත ලක්ෂ්‍යයකින් ආරම්භ කොට එක්තරා අනුපිළිවෙළකට චිත්‍රය සම්පූර්ණ කිරීමට යොමු වේ. මෙහි දී පළමු අදියරය සහ අවසාන අදියරය අතර අදියර ගණනාවක් පවතී. සිතුවම පිළිගත හැකි ලෙසින් සම්පූර්ණ ව, මනා ව නිමැවෙනුයේ අවසන් අදියරය ද අවසන් වූ පසු ව පමණි. අතරමැදි අදියරයන්, ඒකීය ව වටහා ගැණෙන මුල් සිතුවමට හෝ අවසන් අදියරය නිම වීමෙහි ප්‍රතිඵලයක් ලෙසින් ඇති වුණු ආවසානික ඵලයට අයත් නො වන අතර, මෙම අතරමැදි අදියරයන් අප්‍රකාශ්‍ය (Inexpressible) වේ. (Karunaratne, 1985, p.57)

මේ හා සමාන නිදසුනක් ඇසුරින් මෙකී සංසිද්ධිය අවබෝධ කොට ගත හැකි ය. කිරි, මුදවන ලද කිරි බවට පත්වීමේ ක්‍රියාවලිය මෙන් ම බීජයක් ගසක් බවට පත්වීමේ ක්‍රියාවලිය ද අදියර ගණනාවක දී සිදු වන්නකි. ස්ඵෝට, ධ්වනි මත අනුරූපණය වීමේ ක්‍රියාවලිය ද මේ හා සමාන ය. ස්ඵෝටයෙන් ධ්වනි අනාවරණය කෙරෙන එක් නිශ්චිත පිළිවෙළක් ඇත. ඒ දෙක අතර පවත්නා අදියරයන් අප්‍රකාශ්‍ය නොහොත් භර්තෘහරී පවසන පරිදි "අනුපාඛ්‍යෙය" වේ. ඒවා ස්ඵෝට හෝ ධ්වනි හෝ නොවන නමුත් යථෝක්ත ව දැක්වුණු කිරි මිදෙන තත්ත්වයට පත්වීමේ සංසිද්ධියෙහි දී මෙන් අතරමැදි පරිණාමයන්ට භාජනය වන තත්ත්ව වේ. මෙසේ අනුක්‍රමික පිළිවෙළකට නීති මාලාවක් යෙදීමෙහි ප්‍රතිඵල වන අතරමැදි පරිණාමනයන් නොහොත් අදියරයන් සහ එක් එක් ව්‍යුත්පන්න ව්‍යූහය (ආවසානික ඵලය) ක්‍රමයෙන් එහි මතුපිට ව්‍යූහය ලෙස පරිණාමනය වීම යනු එහි අවසාන අවබෝධය වන ශබ්ද ව්‍යූහය වෙත පැමිණීමට උපකාරී වන උපකරණයකි. මේ අනුව "වාක්‍යවල යටි ව්‍යූහය වන ස්ඵෝට, නිශ්චිත අනුපිළිවෙළකට යොදන ව්‍යාකරණ අනුරූපණ සමූහයක් (භර්තෘහරී පවසන ආවෘත්තීන්) අනුව මතුපිට ව්‍යූහයට අනුරූපණය (Transformation) වේ" (Karunaratne, 1985, p59) යැ යි උපකල්පනය කිරීම සාධාරණ ය. ස්ඵෝට යන්න කිසියම් භාෂාවක සියලු අර්ථවත් වාගාලාපයන්ට යටින් පවත්නා වාග්විද්‍යාත්මක ඒකකය වන අතර ම එය කිසියම් භාෂාවක ශබ්දවිද්‍යාත්මක ව්‍යූහය මඟින් නිරූපණය කෙරෙන බවට වන මූලික අදහස එයින් ස්ඵුට වේ. මින් ඉහත දී විග්‍රහ කරන ලද චොම්ස්කිගේ ජනක ප්‍රතියෝජන ව්‍යාකරණයෙහි දී වාක්‍යයක ගැඹුරු ව්‍යූහය මතුපිට ව්‍යූහය වෙත ප්‍රතියෝජනය නොහොත් අනුරූපණය වීමේ සංසිද්ධිය, එනම් වාක්‍යයක් එහි අර්ථය සමඟ වාක්‍යයක් ලෙස ග්‍රහණය කරගැනීමේ ක්‍රියාවලිය හා යථෝක්ත අදහස සමපාත වන බව පෙනී යයි. කෙසේ වුව ද භර්තෘහරීගේ "ධ්වනි" සංකල්පය ඔස්සේ පැහැදිලි වන්නේ ස්ඵෝටවාදය මඟින් අර්ථවිචාරය ඇතුළු භාෂාවේ ව්‍යූහයෙහි ගැඹුරුතම අඩවි පවා ස්පර්ශ වී ඇති බව යි.

### 3.3 **භාෂාවෙහි සංරචකත්‍රය** (Three Components of Language)

භර්තෘහරී භාෂාව (වාච්) ස්තර තුනකට බෙදා දක්වා ඇත (Karunaratne, 1985).

1. පශ්‍යන්ති - දකිනා දෙය. මෙහි දී භාෂණය සහ චින්තනය අතර වෙනසක් නැත. හුදු භාෂණය යි.
2. මධ්‍යමා - අතරමැදි දෙය. එනම්, ශබ්ද විද්‍යාත්මක සංස්ථිතිය වශයෙන් පවත්නා වාගාලාපය යි. මධ්‍යමා යනු කිසියම් ප්‍රකාශයක ව්‍යුත්පත්තියෙහි මානසික පරිවර්තනයට සමාන, එක් විශේෂිත අනුපිළිවෙළකට පෙනෙන අතරමැදි අවධි සමූහයකි.
3. වෛඛරී - ප්‍රකාශිත දෙය. එනම්, භාෂකයා උච්චාරණය කරන හා ශ්‍රාවකයාට ශ්‍රවණය වන සැබෑ ශබ්ද රාශිය යි. පදිමයන්ගේ අනුක්‍රමික රටාවකින් යුතු වන "ආනුපූර්වීනිත්‍ය" (Successive Morphemes of an Expression) ප්‍රකාශන මීට අයත් වේ.

භර්තෘහරී භාෂාවේ මූලික ඒකකය ලෙස සලකන්නේ වාක්‍යය යි. විග්‍රහාත්මක වශයෙන් ශබ්ද, පද, වාක්‍ය ලෙස ප්‍රධාන ස්තර ත්‍රයක් හා ඒවාට අයත් අනුස්තරවලින් භාෂාව සමන්විත වුව ද භර්තෘහරීගේ භාෂාමය දර්ශනයට අනුව එම ඒකක සියල්ල ම නිත්‍ය වන අතර, ප්‍රාථමික (මූලික) ඒකකය වන්නේ වාක්‍යය යි. එය අර්ථය මූලික වූවකි. "පදයක් නොමැති කල හෝ අභාවිත කල්හි, එම පදය සඳහා ආකාඞ්ක්ෂාවක් නොමැති යම් අරුතක් වේ ද එම අර්ථය වාක්‍යයක් සංඥා කරයි. එබඳු සංඥාකාරක වාක්‍යයක ඇත්තේ එක ම පදයක් පමණකි. ඉදින් කේවල ශබ්දිමයක් වුව කිසියම් මනා වූ අරුතක් පවසන්නේ නම් එය පදයක් වන්නේ ය" (සෙනෙවිරත්න, 2005, 32).

වාක්‍යාර්ථය අවබෝධ කොට ගත හැකි ක්‍රම කිහිපයක් හඳුනා ගත හැකි ය (සෙනෙවිරත්න, 2005).

1. පදයන්ගේ සාමාන්‍ය අර්ථයේ ඒකාබද්ධතාවක් (සංසර්ග) වශයෙන්
2. පදගතාර්ථයට අමතර ව ලැබෙන්නා වූ අරුතක් (ආධික) වශයෙන්
3. අදහස් නො කරන ලද වස්තු කෙරෙන් වෙනස් වූ විභේදනයක් (අපෝහ, භේද) වශයෙන්

4. සම්බන්ධය පිහිටුවීමක් (සම්බන්ධ) වශයෙන්
5. පොදු අර්ථ සහිත පද (සාමාන්‍ය), විශේෂ අරුත් (විශිෂ්ට) සමග එක් කරන්නා වූ සම්බන්ධයක් වශයෙන්
6. ක්‍රියාපදයෙහි සංඥිත වූ ද වාක්‍යය සතු අවයවයන්ගේ අරුත් විසින් වෙසෙසන ලද්දා වූ ද කාර්යය (විශිෂ්ටක්‍රියා) වශයෙන්

මේ ආකාරයෙන්, හර්තෘහරී දක්වන භාෂාව පිළිබඳ දර්ශනයට අනුව වාක්‍යාර්ථය සුබෝධනය වීම යනු ක්‍ෂණික වුව ද සංකීර්ණ වූ ක්‍රියාවලියක් බව පැහැදිලි වේ.

ස්ඵෝටය පිළිබඳ විග්‍රහ කරන හර්තෘහරී පවසන්නේ, ස්ඵෝටය සමන්විත වනුයේ විවිධ භාෂණේන්ද්‍රිය, ඒවාට අදාළ වූ කරණ ගැටීම් හා වෙන්වීම් මඟින් නිපදවනු ලබන ශබ්දෝච්චාරණයන්ගෙනි. හෙතෙම එම අදහස මෙසේ ගෙන එයි.

යඃ සංයොගවිභාගාභ්‍යාං කරණෛරුපජන්‍යතෙ
ස ස්ඵොටඃ ශබ්දජාඃ ශබ්දා
ධ්වනයො'න්‍යෛරුදාහෘතාඃ (Pillai, 1971, p.61)

මෙහි දී භාෂකයා විසින් නිපදවනු ලබන ශබ්ද ක්‍ෂණයකින් අන්තර්ධාන වුව ද මුල් ශබ්දයන්ගේ පරාවර්තනය ලෙසින් පැතිර යන ඒවා අනෙක් ශබ්ද නිපදවනු පිණිස ද හේතුකාරක වේ. ස්ඵෝටය විසින් නිපදවනු ලබන මෙම අප්‍රධාන ශබ්ද "ධ්වනි" ලෙස හැඳින්වේ. ස්ඵෝටවාදයෙන් ලද ආලෝකය ඔස්සේ "ධ්වනිවාදය" ඉදිරිපත් කරන ආනන්දවර්ධන ''ධ්වනිය'' අර්ථ දක්වනුයේ මෙසේ ය.

යාත්‍රාර්ථඃ ශබ්දො වා
තමර්ථමුපසර්ජනීකෘතස්වාර්ථෞ
ව්‍යඞ්ක්තඃ කාව්‍යවිශේෂඃ ස ධ්වනිරිති සූරිභිඃ කථිතඃ
(සේනානායක, 1969, 523)

අර්ථය : යම්කිසි රචනයක ශබ්දය හෝ අර්ථය අප්‍රධාන වශයෙන් පෙනී සිටිමින් ව්‍යංග්‍යාර්ථයක් පැහැදිලි කරයි ද එය සූරීන් විසින් ධ්වනිය යැයි කියන ලදී.

භාෂකයා නිපදවන ශබ්ද පිළිබඳ ව හර්තෘහරීගේ යථෝක්ත විග්‍රහය ඔස්සේ පැහැදිලි වනුයේ ස්ඵෝටවාදයෙහි දී ශබ්ද මූලික කාර්යභාරයක් ඉටු කරන බව යි. ස්ඵෝටය අනාවරණය වනුයේ නොහොත් අවබෝධ වනුයේ නිශ්චිත අනුක්‍රමයක් සහිත ව නිපදවෙන අඛණ්ඩ ශබ්ද සන්තතියක් මඟිනි. භාෂකයා විසින් උච්චාරණය කරනු ලබන සෑම ශබ්දයක් ම පදයේ හෝ වාක්‍යයේ හෝ වාගාලාපයේ ස්ඵෝටය ප්‍රකාශ කරනු පිණිස උපකාරී වේ. ශබ්ද ක්‍රමයෙන් වැඩෙමින් මෙම ස්ඵෝටය හෙළි කිරීම සඳහා දායක වේ. වාක්‍යයක සෑම වර්ණයක් ම දායකත්වය සපයනුයේ එක ම ස්ඵෝටය අනාවරණය කරනු පිණිස ය. මින් ඉහත දක්වන ලද අතරමැදි පියවර ගණනාවකින් යුතු සිතුවම නිර්මාණය කිරීම පිළිබඳ නිදර්ශනය මෙහි දී නැවත සිහිපත් කොට ගත හැකි ය. පිළිවෙළින් එම ශබ්ද වැඩෙමින් පැමිණ අවසානයේ දී ස්ඵෝටයෙහි කූටප්‍රාප්තිය සනිටුහන් වනුයේ අවසන් ශබ්දයෙනි. මෙය හර්තෘහරී පහත පරිදි පෙන්වා දී ඇත.

නාදෛරාහිතබීජායාමන්ත්‍යෙන ධ්වනිනා සහ
ආවෘත්තිපරිපාකායාං බුද්ධෞ ශබ්දො'වධාර්යතෙ
(Pillai, 1971, p.19)

අවසන් ශබ්දය මඟින් පදය ශ්‍රාවකයාගේ මනසෙහි ග්‍රහණයට ලක් කෙරේ. ශබ්ද විසින් බීජය වපුරනු ලබන අතර එකී බීජය මුහුකුරා යැවීම සිදු කරනුයේ ශබ්ද උච්චාරණය කෙරෙන අනුක්‍රමය (ආවෘත්තී) විසිනි. අවසන් ශබ්දයත් සමග පරිපාකයට පත් අවසන් හැඟීමෙන් අර්ථප්‍රතීතිය සිදු වේ.

ස්ඵෝටය අවබෝධ වීම සම්බන්ධයෙන් හර්තෘහරී දක්වන තවත් පැහැදිලි කිරීමක් පහත පරිදි හඳුනා ගත හැකි ය.

යථානුවාකඃ ශ්ලොකො වා සොඪත්වමුපගච්ඡති
ආවෘත්ත්‍යා න තු ස ග්‍රන්ථඃ ප්‍රත්‍යාවෘත්ති නිරූප්‍යතෙ
(Pillai, 1971, p.18)

මෙම විග්‍රහය අනුව, ශිෂ්‍යයෙක් කිසියම් ශ්ලෝකයක් මතක තබා ගැනීම සඳහා කිහිප වරක් ම එය කියවයි. පළමු වරට කියැවීමේ දී ලබා ගත් අවබෝධයට හා මතකයට වඩා මඳක් වැඩිපුර ඔහු දෙවැනිවර කියැවීමේ දී එය වටහා ගනී; මතක තබා ගනී. තෙවැනි වර දී ඔහුට ඊටත් වඩා හොඳින් එය සිදු කළ හැකි ය. මේ ආකාරයට බොහෝ වාරයක් මනා සිහියකින් යුතු ව කියවන විට මින් පෙර කියැවීම්වල දී ලද වටහාගැනීම්වල සහාය ද ඇති ව අවසාන කියැවීමේ දී එම ශ්ලෝකය සම්පූර්ණයෙන් ම වටහාගැනීමට හා සිහියේ තබා ගැනීමට හැකි වේ. එය අවසන් වර කියැවීමෙහි ප්‍රතිඵලයක් පමණක් නො වේ. කියැවීම් සන්තතියක ප්‍රතිඵලයකි. සිතුවමක් නිර්මාණය කිරීම අවසන් පින්සල් පහරෙහි ප්‍රතිඵලය නො වේ; අදියර ගණනාවක අනුක්‍රමික ප්‍රතිඵලයකි. එහෙත් අවසන් ඵලය උදෙසා එම සියලු අදියර එක ම ව්‍යුහයක් ලෙසින් මිස කේවල වශයෙන් දර්ශනය වීම සිදු නො වේ. අප වෙත දර්ශනය වනුයේ සිතුවමෙහි සමස්තය මිස එක් එක් පැන්සල් ඉර හෝ පින්සල් පහර හෝ තනි තනි වර්ණය නො වේ. අර්ථප්‍රතීතියෙහි දී ද වාක්‍යය නමැති අඛණ්ඩ ශබ්ද සන්තතියෙහි අනුක්‍රමික ශ්‍රවණය කිරීම ඔස්සේ සමස්ත අර්ථය මනසෙහි බැබළීම සිදු වන බව මේ අනුව පැහැදිලි වේ.

ස්ඵෝට මූලික වශයෙන් වර්ග අටකි (Brough, 1951, pp. 42-43).

1. වර්ණස්ඵෝට
2. පදස්ඵෝට

3. වාක්‍යස්ඵෝට
4. අඛණ්ඩපදස්ඵෝට
5. අඛණ්ඩවාක්‍යස්ඵෝට
6. වර්ණජාතිස්ඵෝට
7. පදජාතිස්ඵෝට
8. වාක්‍යජාතිස්ඵෝට

භර්තෘහරී මේ අතුරින් උත්තම කොට සලකා අදහනුයේ "අඛණ්ඩවාක්‍යස්ඵෝටය" යි. "ස්ඵෝටය අභේද්‍ය, අනවයවී, සමාහිත ඒකකයක් වශයෙන් ගත් හෙයින් ද සමස්ත ප්‍රකාශනය ම ස්ඵෝටය වශයෙන් ගත යුතු ය යන කල්පනාව කරණ කොට ගෙන ද ස්ඵෝටය පිළිබඳ ඔහුගේ දර්ශනය 'අඛණ්ඩවාක්‍යස්ඵෝට' ලෙසින් නම් කිරීම සුදුසු ය" (සෙනෙවිරත්න, 2005, 45).

වර්ණස්ඵෝටඃ සෑම වර්ණයක් ම ස්ඵෝටයක් වන බව මෙයින් අදහස් වේ. කිසියම් ප්‍රකෘතියක් හෝ ප්‍රත්‍යයක් තනාලන වර්ණයක් හෝ වර්ණ 'ස්ඵෝට' වශයෙන් සැලකීම වර්ණස්ඵෝටවාදයේ දී සිදු වේ.

පදස්ඵෝටඃ නිශ්චිත අනුක්‍රමයක් සහිත වර්ණ සන්තතිය විසින් අර්ථය ගෙන දෙනු ලබන බව පිළිගැණෙන හෙයින් වර්ණ සමුච්චයකින් තැනෙන පදය ද අර්ථවාහී ලෙස සැලකීම පදස්ඵෝටයෙහි දී සිදු වේ.

වාක්‍යස්ඵෝටඃ සමස්ත වාක්‍යය ම කිසිදු විභේදනයකින් තොර ව අර්ථවත් ඒකකය ලෙසින් සැලකීම මෙහි දී සිදු වේ.

ජාතිස්ඵෝටඃ ව්‍යක්ති වශයෙන් වස්තු වෙන් වෙන් ව ගැනීමට වඩා ජාති වශයෙන් ගැනීම මෙහි දී සිදු වේ. එනම්, වස්තුන්ගේ පොදු ගුණ-ලක්ෂණ නොහොත් සාමාන්‍යයන් හඳුනාගැනීම යි. භාරතීය උපනිෂද් දර්ශනයෙහි ඡාන්දෝග්‍ය උපනිෂද්හි දැක්වෙන " ''සියල්ල වනාහි බ්‍රහ්මන් ය - සර්වං ඛලූ ඉදං බ්‍රහ්ම'' (කළුපහන, 1963, 56) යන අදහස මැනැවින් ඉස්මතු කිරීම මෙහි දී සිදු වූ බවක් පෙනී යයි.

අඛණ්ඩස්ඵෝටඃ 'අඛණ්ඩපදස්ඵෝටය' හා 'අඛණ්ඩවාක්‍යස්ඵෝටය' ඉදිරිපත් වූයේ පිළිවෙළින් පදය හා වාක්‍යය, අභේද්‍ය-අඛණ්ඩ ඒකකයකි යන මතය පදනම් කොට ගෙන ය. මින් ඉහත දී ද දැක්වුණු පරිදි භර්තෘහරී අඛණ්ඩවාක්‍යස්ඵෝටය ම ස්ඵෝටය ලෙසින් සලකා ඇති බව පෙනී යයි. භර්තෘහරී පවසන පරිදි පදයක් ප්‍රකෘති, ප්‍රත්‍ය ආදි අවයවයන්ට බෙදා දැක්වෙන්නේ හුදෙක් ම අධ්‍යයන පරමාර්ථයෙන් පමණකි. වාක්‍යපදීයයෙහි එන පහත සඳහන අනුව එසේ ඉගෙන ගන්නා දූහුනන්ගේ ප්‍රයෝජනය පිණිස පවත්නා මාර්ගයක් වශයෙන් අර්ථය ජනනය කෙරෙන ඒකක එලෙස පවත්නා බව කියැවේ.

උපායාඃ ශික්ෂමානානාං බාලානාමුපලාලනාඃ
අසත්‍යෙ වර්ත්මනි ස්ථිත්වා තතඃ සත්‍යං සමීහතෙ
(Pillai, 1971, p.91)

මේ අනුව පැහැදිලි වන්නේ අර්ථවාහක පද්ධතියක් ලෙසින් සැලකීමේ දී එහි මූලික ඒකකය ලෙසින් භර්තෘහරී ගෙන ඇත්තේ වාක්‍යය බව යි. එසේ ම හෙතෙම සම්පූර්ණ වාක්‍යය ශ්‍රවණය ඔස්සේ ඇති වන අවසාන හැඟීම 'ස්ඵෝටය' ලෙසින් සලකා ඇති බව පැහැදිලි ය. වාක්‍යයක් ශ්‍රවණය කිරීමේ දී හෝ පඨනය කිරීමේ දී එය අනුක්‍රමික පිළිවෙළකින් යුතු ව නමුත් එම සමස්තය ක්ෂණික ව වටහාගැනීම ග්‍රාහකයාගේ මනස තුළ සිදු වන්නකි. කිසියම් වාගාලාපයක් අප වටහාගනුයේ එය මුල සිට අග දක්වා පිළිවෙළින් ශ්‍රවණය හෝ පඨනය කිරීමෙන් පසු ය. ඒ අනුව වාක්‍යයක් වර්ණ, ප්‍රකෘති, ප්‍රත්‍ය නොහොත් වාග්විද්‍යානුකූල ව ගතහොත් ශබ්ද, ශබ්දිම, පදිම යනාදි වශයෙන් කොටස්වලට ඛණ්ඩනය කොට සම්පූර්ණ වාක්‍යයක හෝ වාගාලාපයක අර්ථප්‍රතීතිය සිදු කළ නොහැකි ය. එම විභේදනය වූ කලී භාෂාධ්‍යයනය විෂයයෙහි ලා ගෝචර වන තාක්ෂණික කර්තව්‍යයක් පමණකි. අර්ථප්‍රතීතිය පිළිබඳ ව එන විග්‍රහය වූ කලී මනෝමූලික විග්‍රහයකි. භාෂකයා පවසන දේ හෝ කිසියම් අවස්ථාවක තමන් විසින් ම පඨනය කරනු ලබන දේ ග්‍රාහකයා (ශ්‍රාවකයා හෝ පාඨකයා) විසින් වටහා ගනු ලබනුයේ සම්පූර්ණයෙන් අසා හෝ කියවා නිම කරන ලද වාගාලාපයක් හෝ වාක්‍යයක් ලෙස මිස විභේදිත කේවල අවයව ලෙස නො වේ. භාෂාවේ යථෝක්ත විභේදිත ස්තර පිළිබඳ අධ්‍යයනය කිරීම අනවශ්‍ය බවක් ඉන් අදහස් නො වේ. භර්තෘහරී ද වර්ණ, පද යනාදි අංග කෙරේ අවධානය යොමු කොට ඇති ආකාරය මින් ඉහත දී විග්‍රහ කරන ලදී. මෙහි දී අර්ථප්‍රතීතිය නමැති ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයේ දී නොහොත් අර්ථාවබෝධයෙහි දී වැදගත් ලෙසින් සැලකිය යුතු වන්නේ "වාක්‍යය" නමැති සම්පූර්ණ ඒකකය මිස එය සමන්විත වන කේවල අවයව නොවන බව භර්තෘහරී දක්වන ඉතා වැදගත් අදහස යි. මේ අදහස මූලික කොට ගෙන භර්තෘහරී මෙසේ පවසයි.

නාදෛරාහිතබීජායාමන්ත්‍යෙන ධ්වනිනා සහ
ආවෘත්තිපරිපාකායාං බුද්ධෞ ශබ්දො'වධාර්යතෙ
(Pillai, 1971, p.19)

අර්ථයඃ අවසන් ශබ්දය සමඟ වචනය අසන්නාගේ මනස විසින් ග්‍රහණය කරගනු ලබයි. ශබ්ද මඟින් මනසෙහි බීජ වපුරා ඇති අතර ශබ්ද අනුපිළිවෙළින් පැවසීමෙන් (ආවෘත්ති මඟින්) එම බීජය මුහුකුරා යන තත්ත්වයට පත් කෙරේ.

මෙයින් පැහැදිලි වන්නේ අර්ථ ප්‍රතීතිය, වාක්‍යයාගේ ශ්‍රවණයත් සමඟ ම ස්ඵෝටයක් ලෙසින් එක්වර ම ශ්‍රාවකයාගේ සිත්හි පහළ වන බව යි. වාක්‍ය ශ්‍රවණයෙහි දී පමණක් නො ව පඨනයෙහි දී ද අර්ථාවබෝධය නොහොත් අර්ථප්‍රතීතිය සිදු වන ක්‍රියාවලිය මේ හා සමාන ය. පූර්වයෙහි උද්ග්‍රහණය

කරගන්නා ලද අනුභූතීන්ගෙන් සහ සංස්කාරවලින් සමන්විත ශ්‍රාවකයාගේ සහ පාඨකයාගේ මනස විසින් අඛණ්ඩ වූ භාෂණමය ශබ්ද සන්තතියකින් යුතු වාක්‍යයක් ශ්‍රවණය කිරීමේ දී හෝ පඨනය කිරීමේ දී එම ශබ්ද සන්තතිය අවසානයෙහි දී මුහුකුරා යැමෙන් අර්ථාවබෝධය සිදු වේ. අනුභූති පරිණත තත්ත්වයට පත් වූ විට සංස්කාර යැ යි කියනු ලැබේ. එනම්, ළදරු වියෙහි සිට ම මනුෂ්‍යයා භාෂා උපාර්ජනයෙහි දී සිදු කරනුයේ භාෂාව උද්ග්‍රහණය කොට ගැනීම පමණක් නො ව, අත්දැකීම් නොහොත් අනුභූති රැස් කිරීම යි. අනුභූති වටහාගැනීම හා ප්‍රකාශනීයත්වයට පත් කිරීම පිණිස භාෂාව භාවිත වේ. පරිණත වූ මනසක දී අඛණ්ඩ ශබ්දාවලියක් ශ්‍රවණය කිරීමෙන් පසු ව සිදු වන අර්ථප්‍රතීතිය ස්ඵෝටය වේ. එකිනෙකාගේ අනුභූති සහ ඒවායේ පරිණතවීම නොහොත් සංස්කාර බවට පත්වීම විවිධාකාර වේ. නැතහොත් පුද්ගලානුබද්ධ වේ. භාෂණමය ප්‍රකාශනයක අර්ථය වටහාගැනීම ද පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වනුයේ එබැවිනි. මින් ඉහත දී විග්‍රහ කරන ලද ආවස්ථික ප්‍රකරණයට අදාළ අවස්ථාවල දී ප්‍රකරණාර්ථය වටහාගැනීමට හැකි වීම හෝ නොහැකි වීම අනුභූති (අත්දැකීම්) සහ සංස්කාර මත තීරණය වේ.

## 4. නිගමන සහ නිර්දේශ

භාෂාවෙහි වැදගත් ම අංශයක් ලෙසින් "අර්ථය" හඳුනා ගත හැකි ය. භාෂාවේ මූලික ම කාර්යය වන සන්නිවේදනයෙහි දී සිදු වන්නේ කිසියම් අර්ථයක් භාෂාව මඟින් හුවමාරු වීමකි. නූතන වාග්විද්‍යාවෙහි දී අවධානයට යොමු කෙරෙන අංශ ලෙසින් ශබ්ද විචාරය, පදිම විචාරය, වාක්‍ය විචාරය යන ක්ෂේත්‍රවලට අමතර ව "අර්ථ විචාරය" යනුයෙන් ද අංශයක් අන්තර්ගත වන්නේ අර්ථය වනාහි භාෂාවේ වැදගත් ම කොටසක් වන බැවිනි. අර්ථවිචාරයෙහි දී සිදු වන්නේ කිසියම් භාෂාවක වචනවල, වාක්‍ය ඛණ්ඩවල හෝ වාගාලාපවල අර්ථය පිළිබඳ අධ්‍යයනය කිරීම යි. මනුෂ්‍යයාගේ මනසෙහි පවත්නා අර්ථය ප්‍රකාශ කරනු පිණිස භාෂාවක ව්‍යූහය සැකසී ඇත. මනුෂ්‍යයා ස්වකීය අදහස් සමර්පණය කරගනු පිණිස භාෂණය සේ ම ලේඛනය ද භාවිත කරයි. අර්ථවිචාරයේ දී අවධානයට යොමු වන්නේ භාෂාවේ වාගාලාප ආදියෙහි අර්ථය ජනනය කෙරෙන ව්‍යූහාත්මක ක්‍රියාවලිය සහ එහි මනෝමූලික සහ සම්බන්ධය පිළිබඳ ව යි. අර්ථප්‍රතීතිය නොහොත් අර්ථජනනය හා අර්ථාවබෝධය සිදු වන ආකාරය ද එහි දී ප්‍රමුඛ වේ.

භාෂාවේ අර්ථ ජනනය නොහොත් අර්ථප්‍රතීතිය හා අර්ථාවබෝධය සිදු වන ආකාරය පිළිබඳ පුරාණ භාරතීය සංස්කෘත ශික්ෂාවෙහි දී ඉතා ගැඹුරින් විග්‍රහ වී ඇති බව පෙනී යයි. භාෂීය ශබ්ද සම්පාදනය හා සම්ප්‍රේෂණය, ඒ ඔස්සේ අර්ථවාහක ව්‍යාපාරයක් ක්‍රියාත්මක වීම, අර්ථප්‍රතීතිය සිදු වීම හා ශ්‍රාවකයාගේ මනෝමූලික ස්වයංක්‍රීය ක්‍රියාවලියක් ලෙසින් අර්ථාවබෝධය සිදු වන ආකාරය පිළිබඳ භාරතීය භාෂාඥයන්ගේ දාර්ශනික විග්‍රහ අතුරින් ''ස්ඵෝටවාදය" නමැති සිද්ධාන්තය ප්‍රමුඛ වේ. වාක්‍ය විචාරය (syntax) සම්බන්ධයෙන් භර්තෘහරීගේ වාක්‍යපදීය ඇතුළු සංස්කෘත ප්‍රාමාණික ග්‍රන්ථ සමුච්චය මඟින් පිළිගන්නා විෂයයාවකාශය සමඟ නූතන බටහිර අධ්‍යයනක්ෂේත්‍රය ද මැනැවින් සමපාත වන අතර ම වාක්‍යයාගේ අර්ථප්‍රතීතිය සම්බන්ධයෙන් භර්තෘහරී ඇතුළු භාෂා තත්ත්වඥයන් දක්වන විග්‍රහය බටහිර (නූතන) වාග්විද්‍යා ක්ෂේත්‍රයෙහි ඥානවිභාගීය අවකාශය ද පුළුල් වීමට හේතු වී ඇත. වාක්‍යයාගේ අර්ථප්‍රතීතිය සම්බන්ධයෙන් "ස්ඵෝට" නම් වූ අර්ථවාහක ව්‍යාපාරය උපයුක්ත කොට ගනිමින් භර්තෘහරී සිදු කරන විග්‍රහය මෙහි දී වැදගත් වේ. භර්තෘහරීට ප්‍රථමයෙන් ද ස්ඵෝට සිද්ධාන්තය විවිධ භාෂාඥයන් විසින් උපයුක්ත කොට ගැනුණ ද වාක්‍යය සහ අර්ථය සම්බන්ධයෙන් එය උපයුක්ත කොට ගෙන පැහැදිලි දාර්ශනික අර්ථවිචාරාත්මක විග්‍රහයක් විධිමත් ආකාරයකින් සිදු කළෝ භර්තෘහරීහු ය. වාක්‍යයාගේ අර්ථප්‍රතීතිය සම්බන්ධයෙන් භර්තෘහරීගේ විග්‍රහය පිළිබඳ යථෝක්ත ගවේෂණය අනුව පහත නිගමන වෙත එළඹිය හැකි ය.

1. ස්ඵෝටය යනුයෙන් හඳුනා ගැණෙනුයේ කිසියම් වාගාලාපයක් හෝ වාක්‍යයක් භාෂකයකු විසින් උච්චාරණය කරනු ලබන විට දී සිදු වන අනුක්‍රමික ශබ්දමය පිපිරීමෙහි අවසාන හැඟීම යි. එහි දී පිට වන ශබ්ද අනුක්‍රමය ක්‍රියා කරනුයේ අර්ථ වාහක ව්‍යාපාරයක් නොහොත් අර්ථවාහක අංශු වශයෙනි.
2. භර්තෘහරී දක්වන අර්ථප්‍රතීතිය පිළිබඳ විග්‍රහයට අනුව භාෂාවෙහි වැදගත් ම හා මූලික ඒකකය වන්නේ වාක්‍යය යි. අර්ථප්‍රතීතිය සඳහා අඛණ්ඩ වූ ශබ්ද, පද අනුක්‍රමයක් භාෂකයාගේ මුවින් පිට වීම අවශ්‍ය වන අතර හුදෙකලා වර්ණ හෝ පද අර්ථප්‍රතීතිය පරිපූර්ණත්වයට පත් නොකරන බව එයින් පැහැදිලි වේ. සියලු ස්ඵෝට අතුරින් භර්තෘහරී අඛණ්ඩවාක්‍යස්ඵෝටය පිළිගනුයේ එබැවිනි.
3. භාෂකයා විසින් උච්චාරණය කරනු ලබන සෑම ශබ්දයක් ම පදයේ හෝ වාක්‍යයේ හෝ වාගාලාපයේ ස්ඵෝටය ප්‍රකාශ කරනු පිණිස උපකාරී වේ. ශබ්ද ක්‍රමයෙන් වැඩෙමින් මෙම ස්ඵෝටය හෙළි කිරීම සඳහා දායක වේ. වාක්‍යයක සෑම වර්ණයක් ම දායකත්වය සපයනුයේ එක ම ස්ඵෝටය අනාවරණය කරනු පිණිස ය. පිළිවෙළින් එම ශබ්ද වැඩෙමින් පැමිණ ස්ඵෝටයෙහි කූටප්‍රාප්තිය සනිටුහන් වනුයේ අවසන් ශබ්දයෙනි.
4. භාෂකයාගේ මුවින් පිට වන වාක්‍යය හෝ වාගාලාපය ඔස්සේ සිදු වන්නේ ස්ඵෝටන යාන්ත්‍රණයක් බව මින් ඉහත දී කියන ලදී. එකී ස්ඵෝටන යාන්ත්‍රණය ඔස්සේ විසරණය වී ග්‍රාහකයාගේ නොහොත් ශ්‍රාවකයාගේ

මනසෙහි තැන්පත් වන ශබ්ද බීජ නොහොත් ස්ඵෝට ඒවා පතිත වන ශබ්ද අනුක්‍රමය අනුව අවසන් ශබ්දය දක්වා ප්‍රරෝහණය වී මුහුකුරා ගොස් අර්ථාවබෝධය සංසිද්ධ වේ. මෙය ක්ෂණික ව සිදු වන ක්‍රියාවලියකි. අර්ථය රැගෙන යන බීජ නොහොත් වාහකයා ස්ඵෝට වේ.

5. අඛණ්ඩ ශබ්දාවලියක් ශ්‍රවණය කිරීමෙන් පසු ව සම්පූර්ණ වූ අර්ථයක් මනසෙහි බැබළී යාම ස්ඵෝටය වේ. අර්ථ ප්‍රතීතිය, වාක්‍යයාගේ සම්පූර්ණ ශ්‍රවණයත් සමඟ ම ස්ඵෝටයක් ලෙසින් එක්වර ම ශ්‍රාවකයාගේ සිත්හි පහළ වේ. එය ශ්‍රවණයෙහි දී පමණක් නොව පඨනයෙහි දී ද ක්‍රියාත්මක වන අර්ථප්‍රතීති යාන්ත්‍රණය යි.
6. වාක්‍ය විචාරය සහ අර්ථ විචාරය සම්බන්ධ නූතන වාග්විද්‍යාත්මක සංකල්ප හා සැසඳීමේ දී නෝම් චොම්ස්කි ඉදිරිපත් කළ ජනක ප්‍රතියෝජන ව්‍යාකරණය අනුව භාෂාමය නිෂ්පාදනයෙහි දී මූලික ඒකකය නොහොත් පදනම "වාක්‍යය" ලෙස සැලකීම ද වාක්‍යයක් ගැඹුරු (යටි) ව්‍යූහයෙහි සිට මතුපිට ව්‍යූහය (පදක-ශබ්දයෝග තලය) දක්වා විකාශනය කිරීම ද අර්ථවිචාරය සම්බන්ධයෙන් භර්තෘහරී ඉදිරිපත් කළ ස්ඵෝටවාදයෙහි න්‍යායාත්මක කරුණු සමඟ සමපාත වන බව පැහැදිලි වේ. කෙසේ වුව ද චොම්ස්කිගේ විග්‍රහයට සියවස් ගණනාවකට පූර්වයෙන් ඉදිරිපත් වී තිබීමත්, අර්ථවිචාරය පිළිබඳ පුළුල් විග්‍රහයක් සහිත පෙරදිග දාර්ශනික සිද්ධාන්තයක් වශයෙන් ස්වකීය අනන්‍යතාව ප්‍රකට කිරීමත් කරණ කොට ගෙන ස්ඵෝටවාදය මෙහි දී උත්කෘෂ්ට වන බව පැහැදිලි වේ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


කළුපහන, ජී. (1963). *භාරතීය දර්ශන ඉතිහාසය.* කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

ගුනසිංහ, එස්. (1989). *චිරන්තන සම්ප්‍රදාය සහ ප්‍රගතිය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, ඩබ්ලිව්. ජී. (1985). නූතන අර්ථ විචාරය හා පුරාතන භාරතීය අර්ථවිචාරවාද. රංජිත් අමරකීර්ති පලිහපිටිය, ප්‍රණීත් නිෂාද අභයසුන්දර, නීල් ලකී ක්‍රිස්ටෝපර් සහ අමරසේකර හෙට්ටිආරච්චි (සංස්.), *ජී.බී. සේනානායක ප්‍රභාෂණය* (17-33). කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, ඩබ්ලිව්. ජී. (2014). *භාෂී සන්නිවේදනය, අර්ථවිචාරය හා උපයෝගිතා විචාරය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, ඩී. සහ රාජපක්ෂ, ආර්. එම්. ඩබ්ලිව්. (1999). *භාෂා උපාර්ජනය.* කැලණිය: දර්ශක ප්‍රකාශන.

සෙනෙවිරත්න, ආර්. (2005). *සංස්කෘත ව්‍යාකරණ දර්ශනයේ පැනෙන ස්ඵෝට සිද්ධාන්තය* (ශාස්ත්‍රවේදී උපාධි නිබන්ධය). පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

සේනානායක, ජී. එස්. බී. (1969). *ධ්වන්‍යාලෝක විවරණය.* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

Behera, P. (2015 December). *The Sphoṭa Theory in Indic Philosophy: the Ancient versus the Modern*. Paper presented at the 22nd International Congress of Vedānta, Jawaharlal Nehru University, India. Retrieved from https://www.researchgate.net/publication/311674353

Brough, J. (1951). Theories of General Linguistics in the Sanskrit Grammarians. *Transaction of the Philological Society 50* (1), 27-46.

Chomsky, N. (1965). *Aspects of the Theory of Syntax.* Massachusetts: Massachusetts Institute of Technology.

Chomsky, N. (2006). *Language and Mind* (3rd Ed.). United Kingdom: Cambridge University Press.

Chomsky, N. (1979). *Language and Responsibility*. New York: Pantheon Books.

Chomsky, N. (2002). *Syntactic Structures* (2nd Ed.). Berlin: Mouton de Gruyter.

De Saussure, F. (1960). *Course in General Linguistics* (Wade Baskin, Trans.) London: Peter Owen LTD (Original Work Published in 1915).

De Silva, M.W.S. (1964). Linguistic Science and the Study of Sinhala. M.W. Sugathapala De Silva (Ed.), *Transactions of the University of Ceylon Linguistic Society* (01-17), University of Ceylon Linguistic Society.

Firth, J. R. (1951). General Linguistics and Descriptive Grammar. *Transactions of the Philological Society, 50* (01), 69-87.

Hawkes, T. (1977). *Structuralism and Semiotics*. London: Methuen & Co. Ltd.

Karunaratne, M. (1985). Theoretical Significance of the *Sphoṭa* Doctrine. *Vidyodaya 13* (2), 53-70.

Pillai, K. R. (Ed.). (1971). *Vākyapadīya - I & II.* Delhi: Motilal Banarsidass.

Prasad, T. (2008). *A Course in Linguistics*. New Delhi: Prentice Hall of India pvt. Ltd.

Whorf, B. L. (1956). Language, Mind and Reality. John B. Carroll (Ed.), *Language, Thought and Reality - Selected Writings of Benjamin Lee Whorf* (246-270), New York: The Technology Press of Massachusetts Institute of Technology and John Wiley & Sons, Inc.